වාර්ෂික වාර්තාව - 2021

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

දැක්ම

සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා දේශීය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් ජාතික හා ජාත්‍යන්තර ඖෂධ අවශ්‍යතා උසස් ප්‍රමිතීන්ගෙන් යුතුව සපුරාලන සේවය මුල් කර ගත් පුරෝගාමී ආයතනයක් වීම.

මෙහෙවර

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ, සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරාලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභසාධනය ඉටු කරමින් සෞඛ්‍ය සම්පන්න සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරීම.

සභාපතිතුමියගේ පණිවිඩය



ආයුර්වේද නිෂ්පාදන ක්ෂේත්‍රයේ පෙර ගමන්කරු වශයෙන් වසර 52ක සංස්ථා ඉතිහාසයේ රු.මි. 630කට ආසන්න වාර්තා ගත නිෂ්පාදනයක් සිදු කිරීමට අපට හැකි විය.

මෙම ජයග්‍රහණය බාධක රාශියක් මධ්‍යයේ ලබා ගත් ජයග්‍රහණයක් වන අතර නිෂ්පාදන වල ප්‍රමීතිය රැකෙන අයුරින් නිෂ්පාදනය වැඩි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමස්ත කළමණාකාරිත්වය කටයුතු කර ඇත. පසුගිය වසර තුළ දී මෙන්ම 2021 වර්ෂයේද රට තුළ පැවති Covid – 19 වසංගත තත්ත්වය රටේ සියලුම කටයුතු වලට මෙන්ම සංස්ථාවටද ඉතා අහිතකර ලෙස බලපෑවේය. විශේෂයෙන්ම නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය දේශීයව සම්පාදනය කර ගැනීමට නොහැකි වීමත්, ආනයන සීමා කිරීම සහ රටෙහි පැවති මුල්‍ය අර්බුදය හේතුවෙන් ආනයන සැපයුම අඩාලවීමත් නිසා නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ප්‍රමාණාත්මකව ලබා ගැනීම ඉතා අසීරු විය. මිල ගණන් කැඳවීම සිදුකර තිබුණ ද වෙළඳලපල මිල ගණන් කෙටි කාලයක් තුළ ඉතා සිඝ්‍රයෙන් වෙනස්වීම නිසා අමු ද්‍රව්‍ය සඳහා අමතර පිරිවැයක් දැරීමට අපට සිදු විය.

සංස්ථාව මඟින් නඩත්තු කරනු ලබන ඔසු උයන් කිහිපයක් පවතින අතර, ඒ සඳහා මෙම වර්ෂයේ දී නඩත්තු හා සංවර්ධන කටයුතු සඳහා සැලකිය යුතු පිරිවැයක් දරා ඇත. මේ තුළින් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය අවම පිරිවැයක් යටතේ සපයා ගැනීමටත්, පරිසර සංරක්ෂණය ඇති කිරීමටත් දායක වීමට හැකිවිය.

ජාතික දුම්කොළ හා මධ්‍යසාර අධිකාරිය විසින් සිදු කරනු ලැබූ පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස, 2021 වර්ෂය තුළදී නව නිෂ්පාදනයක් වශයෙන් ‘‘ බුලත් සැපේ’’ නමින් ඖෂධීය ගුණයෙන් යුතු විටක් හඳුන්වා දීමට අප සංස්ථාව කටයුතු කරන ලදී. මෙම හඳුන්වා දීමේ වැඩසටහන ජාතික දුම්කොළ හා මධ්‍යසාර අධිකාරියේ පූර්ණ දායකත්වය යටතේ සෞඛ්‍ය අමාත්‍ය ගරු නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය සහ දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය ගරු නීතිඥ සිසිර ජයකොඩි මැතිතුමාගේ සහභාගිත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත් වූ අතර විශේෂ ආරාධිතයෙකු ලෙස දඹාන ආදිවාසි නායක වනස්පති උරුවරිගේ වන්නිලැත්තන් ද ඒ සඳහා සහභාගි විය.

වාර්තා ගත නිෂ්පාදනයක් සහ වාර්තා ගත අලෙවියක් සිදු කරමින් 2021 වර්ෂය සාර්ථක කර ගැනීම සඳහා මා හට අවශ්‍ය සහය ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සංස්ථාවේ සියලුම කාර්යය මණ්ඩලය සඳහා ස්තුතිය මේ සමඟ පළ කරමි.

නීතිඥ සාගලා අභයවික්‍රම
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

අධ්‍යක්ෂවරු

නීතීඥ සාගලා අභයවික්‍රම මහත්මිය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සභාපති වශයෙන් සාගලා අභයවික්‍රම මහත්මිය 2019.12.27 දින සිට කටයුතු කරන අතර වසර 50ක සංස්ථා ඉතිහාසයේ ප්‍රථම සභාපතිනිය වේ.ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් පිටවූ පසුව වෘත්තිය නීතිඥවරියක වශයෙන් වසර 18ක පමණ සේවා පළපුරුදක් ලබා ඇත.එමෙන්ම DFCC Bank ආයතනයේ නීති නිලධාරිනියක වශයෙන්ද, ශ්‍රී ලංකා කාන්තා නීතීඥ සංගමයේ උප සභාපතිනිය වශයෙන්ද කටයුතු කර ඇත.

ශාන්ත ලියනගේ මහතා

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ කළමණාකාර අධ්‍යක්ෂ වශයෙන් ශාන්ත ලියනගේ මහතා 2020.01.17 දින සිට කටයුතු කරනු ලබයි.සමුපකාර කළමනාකරණ පුහුණු ආයතනය මඟින් ග්‍රාමීය බැංකු ඩිප්ලෝමාව ලබා ඇති අතර ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු ආයතන ගණනාවක පාඨමාලා සඳහා සහභාගී වී ඇත.මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 24 ඉක්ම වූ සේවා කාලය තුල දී Seeds Guarantee LTD ආයතනයේ සහකාර කළමණාකරු/ දිස්ත්‍රික් ව්‍යාපෘති කළමණාකරු ලෙසද, සර්වෝදය සංවර්ධන මූල්‍ය සමාගමේ කළාපිය කළමණාකරු සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරු යන තනතුරු වල සේවය කර ඇත. එමෙන්ම සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද වර්තමානයේ කටයුතු කරනු ලබයි.

ගීතාමනි සී කරුණාරත්න මහත්මිය

සහකාර ප්‍රාදේශිය ලේකම්වරියක වශයෙන් 1992 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලන සේවයට සම්බන්ධවී ඇති විශේෂ ශ්‍රේණියේ නිලධාරිනියකි.ප්‍රථම උපාධිය රුහුණු විශ්වවිද්‍යාලයේ වාණිජ පීඨය මඟින්ද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන්ද ලබාගෙන ඇත.වසර 28ක සේවා කාලය තුළදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල, අමාත්‍යාංශ ඇතුළු රාජ්‍ය ආයතන රැසක සේවය කර ඇත. දැනට දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියක වශයෙන් සේවය කරනු ලබයි.

රේණුකා කොළඹගේ මහත්මිය

1994 වර්ෂයේ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයට සම්බන්ධ වී ඇති අතර 1994 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා ගණකාධිකාරිවරියක ලෙස තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කර ඇත. 2006 සිට 2018 දක්වා නියෝජ්‍ය කොමසාරිස් (අභ්‍යන්තර විගණන) හා ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ද, 2018 වර්ෂයේ සිට 2021 දක්වා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ලෙසද සේවය කර ඇත. 2011 ජනවාරි මස සිට මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ප්‍රධානී ලෙස සේවය කරමින් සිටින අතර වසර 26ක රාජ්‍ය සේවා පළපුරුද්දක් ලබා ඇත.

බන්දුලසේන ඩයස් දහනායක මහතා

1980 වර්ෂයේ උප දිසාපතිවරයෙක් වශයෙන් රජකාරි ආරම්භ කිරිමෙන් අනතුරුව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක සේවය කිරීමෙන් පසු 2012 වර්ෂයේදී දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් ලෙස කටයුතු කර විශ්‍රාම ලබා ඇත.ප්‍රථම උපාධිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා පීඨය මඟින්ද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ද ලබා ගෙන ඇත. එමෙන්ම කොළඹ විශ්වවිද්‍යාලය මඟින් බලය බෙදීම සහ පළාත් පාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ගෙන ඇත.

ප්‍රදීප් ඒ. පිරිස් මහතා

Asia e University – Malaysiaආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇති අතර ආචාර්ය උපාධිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවති. භාණ්ඩ ප්‍රවාහනය, නැව්ගත කිරීම සහ ගබඩාකරණය පිළිබඳව වසර 32ක පළපුරුද්දක් ලබා ඇත.Colombo Logistic සමූහ ව්‍යාපාරයේ සමූහ අධ්‍යක්ෂක /සාමාන්‍යාධිකාරි ලෙස සේවය කරන අතර The Lions Sightfirst Eye Hospital ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සේවය කරනු ලබයි.

එස්.කේ.ඩබ්.ජී. ගුරුසිංහ මහතා

කොළඹ විශ්වවිද්‍යාලයිය දේශීය වෛද්‍ය විද්‍යායතනයේ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී (B.A.M.S) උපාධිය ලබා ඇත.අනතුරුව වෛද්‍ය සේවයට පිවිස Aitken Spence සමාගමට අයත් මාලදිවයිනේ මීදුප්පාරු සංචාරක හෝටලයේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ ආයුර්වේද වෛද්‍යවරයා ලෙස කටයුතු කළේය. පසුව එම සමාගමටම අයත් නෙප්චුන් ආයුර්වේද හෝටලයේ ආයුර්වේද වෛද්‍යවරයෙකු ලෙස සේවය කර, රජයේ සේවයට එක්ව රත්නපුර ආයුර්වේද රෝහල, ඇහැළියගොඩ හා කරදන ප්‍රදේශ වල ආයුර්වේද බෙහෙත් ශාලා වල සේවය කළේය. දැනට මහරගම නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරි ලෙස සේවය කරයි. මේ වන විට යක්කල වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ කාය චිකිත්සාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව අවසන් කරමින් සිටි. හෙතෙම බද්දේගම ප්‍රදේශය ආශ්‍රිත දිවිතුරේ වෙද පරපුරට අයත්ය.

පටුන

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	-	01 - 19
ආයතනික පාලන වාර්තාව	-	20 - 21
විගණකාධිපති වාර්තාව	-	22 - 34
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	-	35
ආදායම් ප්‍රකාශය	-	36 - 37
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	-	38
ස්කන්ධ ප්‍රග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය	-	39
ගිණුම්කරණ ප්‍රතිපත්ති	-	40 - 49
ගිණුම් පිළිබඳ සටහන්	-	50 - 64
පසුගිය වසර 10ක වැදගත් මූල්‍ය විස්තර	-	65

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - 2021 වර්ෂය

01. හැඳින්වීම

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1969 මැයි 11 වෙනි දින අංක 14853/3 දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් සංස්ථාව පිහිටුවා ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 142 වගන්තියට අනුකූලව 2021.12.31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාව පහත ඉදිරිපත් කරමි.

02. ප්‍රධාන අරමුණු

1. ආයුර්වේද ඖෂධ වර්ග හෛසජ්‍ය ද්‍රව්‍ය සහ සකස් කළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමේ, විකිණීමේ සහ බෙදා හැරීමේ ව්‍යාපාරය කරගෙන යෑම.
2. අත්‍යවශ්‍ය ආයුර්වේද, සිද්ධ හා යුනානි (අමු හා නිෂ්පාදිත ඖෂධ යන දෙවර්ගයම) ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග විකිණීම හා බෙදා හැරීම.
3. දේශීය වශයෙන් නිපදවන අමු ආයුර්වේද ඖෂධ වර්ග මිලට ගැනීම හා එම ඖෂධ වර්ග සකස් කිරීම.
4. ආයුර්වේද ඖෂධ පිළිබඳව ශාස්ත්‍රීය සහ හෛසජ්ජක ද්‍රව්‍ය පර්යේෂණය කිරීම සහ එබඳු ඖෂධ වර්ග ප්‍රමිති කිරීම.
5. ආයුර්වේද ඖෂධාගාර පවත්වාගෙන යෑම සහ ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය ආයුර්වේද ඖෂධ වල දේශීය ඖෂධ වර්ග නිපදවීම.
6. ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළඟිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වා ගෙන යාම.
7. ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම හා මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම.

03. ආයතනික තොරතුරු

3.1 ප්‍රධාන කාර්යාලය සහ නිෂ්පාදනාගාරය

අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න දරණ ස්ථානයේ පිහිටා ඇත.

3.2 අලෙවි මධ්‍යස්ථාන

නාවින්න	: අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න මහරගම.
විජේරාම (වෛද්‍ය සායනයද සමඟ)	: අංක 22, ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ.
මහනුවර (වෛද්‍ය සායනයද සමඟ)	: අංක 70, යටිනුවර වීදිය, මහනුවර.
දියතලාව	: සනානි මන්දිරය, දියතලාව.
අනුරාධපුරය	: ක්‍රීඩාංගන මාවත, බැංකු පෙදෙස, අනුරාධපුරය.
බදුල්ල	: බී 35-36, පළමු මහල, බස්නැවතුම්පොළ, බදුල්ල.
කොටුව	: 2 වන වේදිකාව,කොටුව දුම්රිය ස්ථානය, කොටුව.
රත්නපුර	: අංක 32, බස්නැවතුම් පොළ පාර, රත්නපුර.
මාතර	: අංක 43, පරණ තංගල්ල පාර, කොටුවේගොඩ, මාතර.
යාපනය	: අංක 169, කේ.කේ.එස් පාර, යාපනය.
ගාල්ල	: අංක 38 , ඕල්කට් මාවත,ගාල්ල.
මොණරාගල	: අංක267, වැල්ලවාය පාර, මොණරාගල.
බොරැල්ල	: ආයුර්වේද ජාතික ශික්ෂණ රෝහල, ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත, බොරැල්ල.
මාතලේ	: අංක614-C, ත්‍රිකුණාමලය වීදිය, මාතලේ.
ජා ඇල	: අංක 18, කපුවත්ත, ජා ඇළ.
බෙරුවල	: අංක 149/බී, සමුපකාර මන්දිරය, බෙරුවල.
බස්නාහිර පළාත් සභාව	: අංක 204, පළමු මහල, බස්නාහිර පළාත් සභාව, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
නාරහේන්පිට	: රජවාස, විශේෂ ආර්ථික මධ්‍යස්ථානය, කිරිමණ්ඩල පාර, නාරහේන්පිට.
ඇඹිලිපිටිය	: අංක 87, මොරකැටිය පාර, ඇඹිලිපිටිය.

04. අධ්‍යක්ෂ මණ්ඩලය

1.	නීතිඥ සාගලා අභයවික්‍රම මහත්මිය	-	සභාපති
2.	ශාන්ත ලියනගේ මහතා	-	කළමනාකාර අධ්‍යක්ෂ
3.	පුෂ්පලතා මැණිකේ මහත්මිය (2020.01.29 සිට 2021.02.08)	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
4.	ගීතාමනි සි. කරුණාරත්න මහත්මිය (2021.02.08 සිට)	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
5.	එම්.එච්.එම්. සමීල් මහතා (2020.01.29 සිට 2021.06.28)	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
6.	ආර්. කොළඹගේ මහත්මිය (2021.06.28 සිට)	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
7.	බන්දුලසේන දහනායක මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
8.	ප්‍රදීප් ඒ. පිරිස් මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
9.	වෛද්‍ය එස්.කේ.ඩබ්.ජී. ගුරුසිංහ මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

05. විධායක නිලධාරි මණ්ඩලය

1.	සභාපති	-	නීතිඥ සාගලා අභයවික්‍රම මහත්මිය
2.	කළමනාකාර අධ්‍යක්ෂ	-	ශාන්ත ලියනගේ මහතා
3.	සාමාන්‍යාධිකාරී	-	පී.ඩී.ධම්මික මහතා
4.	සහකාර සාමාන්‍යාධිකාරී (කර්මාන්තශාලා)	-	කේ.ඩී.එම්.ඒ.චන්ද්‍රසේකර මහතා
5.	සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)	-	එම්.ජී. ගයාන් තක්ෂිල මහතා
6.	සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි)	-	බී.එස්. කාරියවසම් මහතා
7.	ප්‍රධාන වෛද්‍ය නිලධාරී (වැ.බ)	-	කේ.ඒ.සී.ඩී. කොඩිකාර මහත්මිය
8.	කළමනාකරු - මුදල්	-	කැලුම් පතිරවසම් මහතා
9.	වෛද්‍ය නිලධාරී	-	එම්.කේ.එන්. ගුණසේකර මහත්මිය
10.	කළමනාකරු - සැලසුම්	-	ජගත් කෝරළගේ මහතා
11.	කළමනාකරු - මානව සම්පත්	-	තිලානි විජේසිංහ මහත්මිය
12.	වෛද්‍ය නිලධාරී	-	ටී.කේ. ලියනගේ මහත්මිය
13.	කළමනාකරු - අලෙවි	-	එච්.එම්.ඩී.ඩී. ධනංජ මහතා
14.	කළමනාකරු - තත්ව පාලන	-	කේ.ඒ.එච්.කේ. කස්තුරිආරච්චි මහතා
15.	කළමනාකරු - පිරිවැය	-	ඒ.ඩී.එස්. ප්‍රේමසිංහ මහත්මිය
16.	කළමනාකරු - කර්මාන්තශාලා	-	නවීන් කරුණාසේන මහතා
17.	කළමනාකරු - සැපයුම් (වැ.බ)	-	දීපනි වන්නිආරච්චි මහත්මිය
18.	වෛද්‍ය නිලධාරී	-	වී.එම්.එල්.එස්. නිමලරත්න මහතා
19.	වෛද්‍ය නිලධාරී	-	එච්.විමංග විජේවර්ධන මහතා
20.	වෛද්‍ය නිලධාරී	-	ඒ.එස්.ඩබ්. සේනාරත්න මහතා

අභ්‍යන්තර විගණන අංශය

1.	අභ්‍යන්තර විගණක	-	ඒ.ඩී.එන්.කේ. ප්‍රේමරත්න මෙනවිය

06. කාර්ය මණ්ඩල සංයුතිය

2021 වර්ෂයේ සේවක මණ්ඩල සංයුතිය

තනතුරු නාමය	කාර්යාලය	නිෂ්පාදනාගාරය	විජේරාම අ.මෙ	නාවින්න අ.මෙ	මහනුවර අ.මෙ	දියතලාව අ.මෙ	බදුල්ල අ.මෙ	අනුරාධපුරය අ.මෙ	පිටකොටුව අ.මෙ	මාතර අ.මෙ	රත්නපුර අ.මෙ	මොණරාගල අ.මෙ	ගාල්ල අ.මෙ	බොරැල්ල අ.මෙ	යාපනය අ.මෙ	මාතලේ අ.මෙ	බෙරුවල අ.මෙ	ජා ඇල අ.මෙ	බස්නාහිර පළාත් අ.මෙ	නිශාවැරටිය ඔසු උයන	මදවච්චිය ඔසු උයන	දංගොල්ල ඔසු උයන	ඇඹිලිපිටිය අ.මෙ	නාරහේන්පිට අ.මෙ	එකතුව
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	04	01																							05
කළමනාකරුවන්	07	07																							14
කණිෂ්ඨ කළමනාකරුවන්	16	01																							17
කළමනාකරණ සහකාර සේවා තාක්ෂණික නිලධාරීන්	04	09																							13
කළමනාකරණ සහකාර සේවා /තාක්ෂණික නොවන නිලධාරීන්	52	17	01	01	01	01	01	01	01	01	01	01	01	01	01	01	01	01	01	01	-	01	01	01	90
ප්‍රාථමික ගණය අර්ධ ශිල්පීය නිලධාරීන්	-	11																							11
ප්‍රාථමික ගණය ශිල්පීය නිලධාරීන්	-	15																							15
ප්‍රාථමික ගණය ශිල්පීය නොවන නිලධාරීන්	13	132	01	01	01	01	01	03	01	01	01	01	01	01	01	01	01	01	01	-	-	01	01	01	167
කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන්	-	-																							00
අනියම් කම්කරු / තාවකාලික කම්කරු	-	-																		19		05			24
එකතුව	96	193	2	2	2	2	2	4	2	2	2	2	2	2	2	2	2	2	2	20	-	7	2	2	356

07. කාර්ය සාධනය

පිරිවැටුම

පසුගිය වර්ෂයේදී සංස්ථාවේ අලෙවිය කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ සුළු පසුබැමකට ලක් වුවද, මෙම වර්ෂයේදී රු.මි.800 ඉක්ම වූ වාර්තා ගත අලෙවියක් ලබා ගැනීමට අපට හැකි විය. මේ සඳහා ප්‍රමාණවත් පරිදි නිමි ඖෂධ අලෙවි අංශය වෙත ලැබීමත්, අලෙවි මධ්‍යස්ථාන ප්‍රමාණය වැඩි කිරීමත්, බෙදැහැරීම් ජාලය තවදුරටත් ශක්තිමත් කිරීමත් ප්‍රධාන වශයෙන්ම බලපා ඇත.



නිෂ්පාදනය

පෙර වසර හා සසඳන විට නිෂ්පාදන ධාරිතාව රු.මි.100 ඉක්ම වූ වර්ධනයක් ලබා ගැනීමට 2021 වර්ෂයේදී අපට හැකි වී ඇත. මේ සඳහා ප්‍රමාණවත් පරිදි අමුද්‍රව්‍ය සපයා ගැනීමට හැකි වීම, සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන ඔසු උයන් වල නිෂ්පාදන ප්‍රමාණවත්ව ලැබීම මෙම නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට ඉවහල් වී ඇත.



බදු පසු ශුද්ධ ලාභය/අලාභය

පසුගිය වසර වල ලාභදායිත්වයක් පෙන්නුම් කර තිබුණද ඉහළ ගොස් ඇති අමු ද්‍රව්‍ය පිරිවැය හමුවේ සහ රට තුළ පැවති තත්ත්වය අනුව, 2021 වර්ෂයේදී අප සංස්ථාව රු.මි.14.5ක අලාභයක් පවති.



08. සේවක දිරිදීමනා සහ සුභසාධනය

8.1 සේවක දිරි ගැන්වීම්

වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවයක් සඳහා සමස්ත කාර්ය මණ්ඩලයටම පහත සඳහන් දීමනා ලබා දෙනු ලැබේ.

- පැමිණීමේ දිරි දීමනාව
- නිෂ්පාදනය මත පදනම් වූ නිෂ්පාදන දිරි දීමනාව
- ඵලදායීතා දීමනාව
- වාර්ෂිකව ප්‍රසාද දීමනා

8.2 සේවක සුභසාධනය

අප සංස්ථාවේ සේවක සුභසාධනය සඳහා පහත සඳහන් වැඩ පිලිවෙළ දැනට ක්‍රියාත්මක කර ඇත.

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සෘජුව සම්බන්ධ වන සියළුම සේවකයින්, අලෙවි මධ්‍යස්ථාන සේවකයින් සහ රියදුරන් සඳහා නිල ඇඳුම් ලබා දී ඇත.
- සියළුම සේවකයින්ට උදෑසන කෙටි ආහාරයක් සමඟ තේ ලබා දීම සහ රාත්‍රී සේවය කරන ලද සේවකයින් වෙත රාත්‍රී ආහාර සැපයීම.
- අවමංගල්‍ය අවස්ථාවලදී සේවකයන් වෙත ලබාදෙන පාංශුකූල දීමනාව ලෙස රු.6,500.00ක් ලබා දීම.
- සිංහල හා හින්දු අළුත් අවුරුදු සැමරුම වෙනුවෙන් අප්‍රේල් මස දී සෑම සේවකයෙකු සඳහාම රු.6,000.00ක තෑගි වවුචර්යක් ලබා දීම.

8.3 ආයතනික සමාජ වගකීම

ආයතනික සමාජ වගකීම වෙනුවෙන් අදාල අනුමත සීමාවන් යටතේ සංස්ථාවේ ඖෂධ මංජුසා ලබා දීම සහ විවිධ රාජ්‍ය සහ ඒ හා සම්බන්ධ උත්සව සඳහා පැමිණෙන ජනතාව වෙත ඔසු පැන් ලබා දීම සිදු කර ඇත.

09. ඖෂධ නිෂ්පාදනය ඒකක වශයෙන් පහත දැක්වේ.

	ඖෂධ නාමය	ඒකකය	2021 වර්ෂය	2020 වර්ෂය	2019 වර්ෂය	2018 වර්ෂය	2017 වර්ෂය
1	අරිෂ්ට/වයින්	මි.ලී.750	87,385	97,084	107,038	89,400	101,086
2	ආසව	මි.ලී.750	71,010	75,174	96,920	88,223	82,594
3	ක්වාථ	මි.ලී.750	104,391	108,655	81,730	82,200	74,714
4	සිරප්	මි.ලී.750	11,949	23,616	48,442	22,629	18,810
5	තෛල	මි.ලී.750	207,305	160,621	198,593	183,608	176,600
6	චූර්ණ	කි.ග්‍රෑ.	27,417	26,110	26,299	24,880	26,428
7	කල්ක/ලේහ/ලේප/මෝදක	කි.ග්‍රෑ.	27,017	17,483	22,810	20,092	22,668
8	රස	කි.ග්‍රෑ.	2,199	1,570	2,395	3,365	2,832
9	වටිකා/ගුලි	කි.ග්‍රෑ.	13,100	11,889	15,637	16,176	13,325
10	**නව නිෂ්පාදන 01**						
	(1) රණහංස රසායනය	කි.ග්‍රෑ.	64	3,935	-	-	7
	(2) ත්‍රිඵලා පෙති	කි.ග්‍රෑ.	1,042	1,293	1,095	852	459
	(3) මේදහරණී පෙති	කි.ග්‍රෑ.	1,927	821	-	1,385	568
	(5) ජීවාලේප බාම්	කි.ග්‍රෑ.	459	212	339	5,405	15
	(6) මධුමේහහරණී පෙති	කි.ග්‍රෑ.	-		985	-	-
11	**නව නිෂ්පාදන**						
	(1) තැම්බුම් හොදි	ග්‍රෑ. 05	360,393	115,800	161,585	139,470	164,360
	(2) පේයාව	ග්‍රෑ. 05	749,472	500,770	420,180	306,470	309,324
	(3) පස් පංගුව	ග්‍රෑ. 50	137,350	89,950	110,060	132,330	115,289
	පස් පංගුව	කි.ග්‍රෑ.	122	95			
	(4) කෝමාරිකා ඇම්පූ	ලී.	-		-	-	1
	කෝමාරිකා ඇම්පූ	මි.ලී.95	42,618	55,631	34,918	22,961	18,675
	(5) ඉරමුසු කුඩු	කි.ග්‍රෑ.	-	10	-	10	610
	(6) බෙලිගැට මද කුඩු	කි.ග්‍රෑ.	-	24	-	16	27
	(7) WENIWEL BODY WASH	5L	-	2			
	WENIWEL BODY WASH	1L	-		-	-	3
	WENIWEL BODY WASH	300ml	53,904	26,439	19,166	18,228	15,067
	WENIWEL BODY WASH	100ml	-	472	4,127	7,586	-
	WENIWEL BODY WASH	65ml	-	343	746	401	-
	WENIWEL BODY WASH	60ml	-		-	-	-
	(8) IRMUSU TEA BOX 25 BAGS	BOX	3,953	5,199	347	3,387	12,045
	(9) CINNAMON HERBAL TEA (NEW) 01 2g	BAG	2,132	9,727	9,168	10,252	292,225
	CINNAMON HERBAL TEA	250g	-		94	200	30
	(10) KOTHALA HIMBUTU HERBAL TEA	50g	512	8,757	2,015	1,474	2,736
	(11) RANAWARA HERBAL TEA BAG	2.5g	-		-	-	1,250
	(12) BELI GETA ULUHAL HERBAL TEA BAG	2.5g	-		-	-	1,250
	(13) CINNAMON CAPSULES 60 Nos	60Nos	1,973	149	3,907	1,474	6,306
	(14) INGURU KOTHTHAMALLI HERBAL TEA BAG	2.5g	-		-	-	1,250
	(15) NELLI RASAKIAD HERBAL TEA BAG	2.5g	1,840	367			
	(16) MEDAHARANEE CAPSULES 60 Nos	60Nos	6,673	1,212	2,873	2,090	2,816
	(17) KOTHALA HIMBUTU CAPSULES	60Nos	3,584	1,911	4,242	3,000	2,334
	(18) ASHWAGANDA CAPSULES	60Nos	5,612	4,560	2,905	-	2,696
	ASHWAGANDA CAPSULES	30Nos	-		-	-	626
	(19) DHATHREE CAPSULES	60Nos	3,667	2,822	2,265	-	2,929
	(20) SUDARSHANA CAPSULES	60Nos	26,238	11,021	6,466	-	3,059
	SUDARSHANA CAPSULES	KG	60	272			
	SUDARSHANA CAPSULES	500g	215				
	SUDARSHANA CAPSULES	250g	77				
	(21) ALOE VERA HERBAL DRINK	5L	-		-	8	6
	ALOE VERA HERBAL DRINK	200ml	-		2,729	7,799	1,411
	(22) NELLI HERBAL DRINK	200ml	-		-	-	1,527
	(23) CUCUMBER FACIAL WASH	5L	-		-	-	1
	CUCUMBER FACIAL WASH	100ml	2,897	702	4,946	1,607	4,495
	CUCUMBER FACIAL WASH	50ml	-		2,495	980	1,851
	(24) PAPAYA FACIAL WASH	5L	-		-	1	1
	PAPAYA FACIAL WASH	100ml	2,878	10,182	4,922	1,404	4,778
	PAPAYA FACIAL WASH	50ml	-		2,884	3,474	2,429
	(25) SANDALWOOD FACIAL WASH	1L	-		-	-	1
	SANDALWOOD FACIAL WASH	100ml	8,325	4,714	8,310	7,025	2,814
	SANDALWOOD FACIAL WASH	50ml	3,485		5,751	5,020	60
	(26) CARROT FACIAL WASH	100ml	-		947	3,491	456

	ඖෂධ නාමය	ඒකකය	2021 වර්ෂය	2020 වර්ෂය	2019 වර්ෂය	2018 වර්ෂය	2017 වර්ෂය
	(27) BEE HONEY	750ml	-		4		
	BEE HONEY	375ml	-		-		1
	BEE HONEY	100ml	11,562		1,829		
	BEE HONEY	28ml	15,894		4,221		
	(28) ABA THEL	250ml	528	7,065	899	1,285	1,021
	ABA THEL	28ml	6,848				
	(29) ELAGI THEL	250ml	11,596	1,267	2,662	684	347
	ELAGI THEL	100ml	10,096	7,250	4,671	2,848	5,053
	ELAGI THEL	28ml	14,313	11,860	2,516	-	2,750
	(30) ENDARU THEL	250ml	517	7,293	-	609	1,031
	ENDARU THEL	28ml	12,604				
	(31) KOHOBA THEL	750ml	-		-	-	1
	KOHOBA THEL	250ml	768				
	KOHOBA THEL	28ml	14,042	6,532	839	971	792
	(32) THALA THEL	250ml	11,579	3,002	2,696	4,031	3,574
	THALA THEL	100ml	16,006	8,538	6,455	6,649	3,212
	THALA THEL	28ml	13,200	6,117	5,164	3,287	3,378
	(33) KOKUM POTHU POWDER	50g	-		-	-	43
	SUDU HADUN POWDER	50g	4,660		-	-	46
	(34) TOTOL BALANCE TEA BAG 2g	2g	-		-	-	30,000
	(35) IRAMUSU POWDER	1KG	-	5	-	10	3
	IRAMUSU POWDER	500g	-	3	-	-	4
	IRAMUSU POWDER	250g	-	2	-	-	9
	(37) Modaka	KG	3,832	2,153	-	1,208	
	(38) PANCHA WALKALA BODY WASH	300ml	7,338	3,598	4,429		
	PANCHA WALKALA BODY WASH	100ml	-	500	1,653		
	(39) ENDARU THEL	28ml	12,604	7,293	2,380		
	(40) MEE THEL	28ml	3,591	6,117	470		
	(41) RANAWARA MAL (DRIED)	250g	-	147			
	(42) BELI MAL (DRIED)	30g	289	2,857			
	(43) SUWADARANI PRATHISHAKTHI PANAYA	5KG	2,200				
	SUWADARANI PRATHISHAKTHI PANAYA	KG	5				
	SUWADARANI PRATHISHAKTHI PANAYA	500g	15,462	1,904			
	SUWADARANI PRATHISHAKTHI PANAYA	50g	256,243	137,563			
	SUWADARANI PRATHISHAKTHI PANAYA TEA BAG	BOX	-	237			
	(44) COVID-19 DOOMAYANAYA	50g	15,919	22,741			
	(45) ETHO KOMARIKA HAND SANITIZING GEL	5L	10	372			
	ETHO KOMARIKA HAND SANITIZING GEL	300ml	-	4,591			
	ETHO KOMARIKA HAND SANITIZING GEL	50ml	3,073	2,275			
	ETHO KOMARIKA HAND SANITIZING GEL	65ml	6,614	8,571			
	(46) KAVALAGRAHA MOUTH WASH	10 pack	13,856	2,401			
	(47) WENIWWL HANDWASH	300ml	613	1,795			
	(48) PERUMLAYAM	10g	-	2,249			
	PERUMLAYAM	5g	-	3,048			
	(49) PRATHISHAKTHI WARDHAKA KASAYA	1KG	4,228	5,656			
	PRATHISHAKTHI WARDHAKA KASAYA	500g	10				
	PRATHISHAKTHI WARDHAKA KASAYA	100g	-	3,851			
	PRATHISHAKTHI WARDHAKA KASAYA	30g	-	13,703			
	PRATHISHAKTHI WARDHAKA KASAYA	50g	15,711	12,068			
	(50) KAHA POWDER	250g	489	426			

10. රාජ්‍ය අංශයට සහ පෞද්ගලික වෙළඳ පොළට අලෙවි කරන ලද ඖෂධ වල වටිනාකම් පහත පරිදි දැක්වේ .

(රු. මිලියන)

	2021 වර්ෂය	**2020** වර්ෂය	**2019** වර්ෂය	**2018** වර්ෂය	**2017** වර්ෂය
රාජ්‍ය අංශය	593.61	517.46	585.63	541.48	492.59
අලෙවි මධ්‍යස්ථානය					
විජේරාම අලෙවි මධ්‍යස්ථානය	9.38	7.22	5.90	6.68	5.06
ජංගම අලෙවිය	45.76	22.85	20.75	21.69	2.21
මහනුවර අලෙවි මධ්‍යස්ථානය	9.15	9.60	8.27	6.63	6.75
දියතලාව අලෙවි මධ්‍යස්ථානය	4.98	4.03	2.66	5.30	3.18
අනුරාධපුරය අලෙවි මධ්‍යස්ථානය	7.22	14.96	17.11	15.06	4.25
බදුල්ල අලෙවි මධ්‍යස්ථානය	4.92	4.68	4.18	6.00	6.02
පිටකොටුව අලෙවි මධ්‍යස්ථානය	3.55	4.03	4.24	5.12	5.26
නාවින්න අලෙවි මධ්‍යස්ථානය	32.59	26.04	10.67	11.49	13.50
අංක 008 ගබඩාව	9.58	4.89	0.46	1.41	2.13
රත්නපුර අලෙවි මධ්‍යස්ථානය	5.33	4.83	4.01	7.19	4.14
යාපනය අලෙවි මධ්‍යස්ථානය	12.05	11.78	7.69	11.23	7.83
ගාල්ල අලෙවි මධ්‍යස්ථානය	8.99	6.48	5.03	6.18	6.16
සෙත්සිරිපාය අලෙවි මධ්‍යස්ථානය	0	1.38	1.85	3.44	2.68
මොණරාගල අලෙවි මධ්‍යස්ථානය	7.78	5.46	3.67	4.49	2.45
මාතර අලෙවි මධ්‍යස්ථානය	10.74	9.47	6.14	7.11	4.86
බොරැල්ල අලෙවි මධ්‍යස්ථානය	7.73	8.09	7.73	8.17	5.99
මාතලේ අලෙවි මධ්‍යස්ථානය	3.61	3.90	3.51	4.33	3.28
අළුත්ගම අලෙවි මධ්‍යස්ථානය	-	1.07	3.00	2.01	-
ජා ඇළ අලෙවි මධ්‍යස්ථානය	7.13	2.26	2.46	0.84	-
බස්නාහිර පළාත් අලෙවි මධ්‍යස්ථානය	5.44	3.92	0.68	-	-
බේරුවල අලෙවි මධ්‍යස්ථානය	7.60	1.89	-	-	-
සුවසිරිපාය අලෙවි මධ්‍යස්ථානය	-	-	-	0.03	0.06
නිකවැරටිය අලෙවි මධ්‍යස්ථානය	-	-	-	-	0.49
නාරහෙන්පිට අලෙවි මධ්‍යස්ථානය	1.98	-	-	-	-
ඇඹිලිපිටිය අලෙවි මධ්‍යස්ථානය	1.14	-	-	-	-
මුළු එකතුව	**800.26**	**676.29**	**705.64**	**675.88**	**578.89**

11. ආදායම බෙදී ගිය අයුරු (ප්‍රතිශතයක් ලෙස)

	2021	2020	2019	2018	2017
විකුණුම්	100.00	100.00	100.00	100.00	100.00
අඩු කළා :- විකුණුම් පිරිවැය	74.21	69.77	68.77	62.74	56.56
දළ ලාභය	25.79	30.23	31.23	37.26	43.44
එකතු කළා - වෙනත් ආදායම්	1.65	1.28	2.12	1.08	0.99
එකතුව	27.44	31.52	33.35	38.34	44.43
අඩු කළා					
ආයතන හා පරිපාලන වියදම්	19.11	19.98	21.37	21.41	21.77
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	10.45	11.88	12.94	12.75	12.06
මූල්‍ය වියදම්	1.28	0.82	0.90	1.06	1.42
මුළු වියදම	30.84	32.67	35.21	35.22	35.25
මෙහෙයුම් ලාභය	(3.40)	(1.16)	(1.86)	3.11	9.18
එකතු කළා - පොළී ආදායම් සහ මෙහෙයුම් නොවන ආදායම්	1.59	2.56	2.30	1.34	0.58
බදු අඩු කිරීමට පෙර ලාභය	(1.81)	1.40	0.45	4.46	9.76
අඩු කළා					
බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන	-	0.50	0.35	1.73	3.08
ශුද්ධ ලාභය	**(1.81)**	**0.90**	**0.09**	**2.72**	**6.68**

12. ලාභ දායකත්වය (රු. මිලියන වලින්)

(රු. මිලියන)

	2021	2020	2019	2018	2017
විකුණුම්	800.22	676.30	705.62	675.88	578.89
අඩු කළා :- විකුණුම් පිරිවැය	593.82	471.83	485.23	426.05	327.45
දළ ලාභය	206.40	204.47	220.39	249.83	251.44
එකතු කළා - වෙනත් ආදායම්	13.21	8.69	14.94	7.29	5.73
මුළු ආදායම	219.61	213.16	235.33	257.12	257.17
අඩු කළා					
ආයතන හා පරිපාලන වියදම්	152.91	135.10	150.80	144.74	126.02
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	83.63	80.34	91.28	81.30	64.83
මූල්‍ය වියදම්	10.27	5.54	6.37	7.15	8.22
මුළු වියදම	246.81	220.98	248.45	233.19	199.07
මෙහෙයුම් ලාභය/අලාභය	(27.20)	(7.82)	(13.12)	23.93	58.10
එකතු කළා - පොළී ආදායම්	12.70	17.28	16.26	9.07	3.34
බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන	-	(3.36)	(2.50)	(11.72)	(17.80)
ශුද්ධ ලාභය/අලාභය	**(14.50)**	**6.10**	**0.64**	**21.28**	**43.64**

13. තිරසාර සංවර්ධනය අරමුණු සාක්ෂාත් කර ගැනීම

එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් 2015 වර්ෂයේ දී එකඟ වී ඇති තිරසාර සංවර්ධන අරමුණු මූලික කරගත්, වර්ෂ 2030 දී සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකා රජය විසින් ඉලක්ක කර ඇති පහත සඳහන් අරමුණු සඳහා 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සෘජු දායකත්වයක් දක්වා ඇත.

1. වන අරමුණ - දරිද්‍රතාවයෙන් තොර වීම.
2. වන අරමුණ - කුසගින්න තුරන් කිරීම.
3. වන අරමුණ - නීරෝගී බව හා යහපැවැත්ම.
4. වන අරමුණ - සුනිසි මෙහෙවර හා ආර්ථික වර්ධනය.
5. වන අරමුණ - වගකීමෙන් යුතු පරිභෝජනය හා නිෂ්පාදනය.

14. නිෂ්පාදනය වැඩි කිරීම

- **අමුද්‍රව්‍ය සපයා ගැනීම**

ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා දේශීය සැපයුම්කරුවන්ගෙන් ඖෂධ මිලදි ගැනීමට සංස්ථාව අතීතයේ සිට කටයුතු කර ඇත. නමුත් ප්‍රමාණාත්මක තොග දේශීයව සපයා ගැනීමට අසීරු බැවින්, එම ඖෂධ බහුලව ඇති ඉන්දියාව වැනි රටවල් වලින් අමුද්‍රව්‍ය ආනයනය කිරීමට සිදු වේ.

රට තුළ ආනයන සීමා පනවා ඇති තත්ත්වය තුළ, තොග වශයෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීමට ගැටළු පැවතුන අතර මිලදි ගනු ලබන අමුද්‍රව්‍ය සඳහා පෙර වසර වලට සාපෙක්ෂව වැඩි මිලක් ගෙවීමට සිදු වුණි. එම නිසා නිෂ්පාදන පිරිවැය පෙර වසර හා සැසඳීමේදී මෙම වර්ෂයේ දී ඉහළ අගයක් ගනී.

2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද දඹාන වැදි ගම්මාන සහ ඒ අවට ඖෂධ එකතු කිරීම මෙම වර්ෂයේ ද ඉතා සාර්ථකව සිදු කරන ලදී. එමඟින් ගුණාත්මයෙන් ඉහළ අමුද්‍රව්‍ය ඖෂධීය වටිනාකම් අඩු නොවන ලෙස සංස්ථාවට ලබා ගනීමට හැකි විය.

අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී අධිකරණය මඟින් සංස්ථාවට නිදහස් කරනු ලබන අමුද්‍රව්‍ය සංස්ථාවේ නිෂ්පාදන කටයුතු සඳහා අතීතයේ සිටම යොදා ගන්නා ලදි. මෙම වර්ෂය තුළදී සැලකිය යුතු අමුද්‍රව්‍ය ප්‍රමාණයක් සංස්ථාව වෙත ලැබී ඇති අතර වෙනිවැල් සහ කංසා ඒ අතර ප්‍රධාන තැනක් ගනී.





15. ඔසු උයන් පාලනය

පරිසර සංරක්ෂණයත් සංස්ථාවට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමත් අරමුණු කර ගනිමින් සංස්ථාව විසින් ඔසු උයන් 03ක් සඳහා ආයෝජනය කර පවත්වාගෙන යයි. එම ඔසු උයන් නිකවැරටිය, මැදවච්චිය සහ දංගොල්ල යන ප්‍රදේශ වල පවත්වා ගෙන යනු ලබයි.

- **නිකවැරටිය ඔසු උයන**

  අක්කර 50කින් සමන්විත නිකවැරටිය ඔසු උයන 2021 වර්ෂය අවසන් වන විට 95%ක ප්‍රමාණයක් ඖෂධ වගාවන් සඳහා යොදා ගෙන ඇත. නිකවැරටිය ඔසු උයන තුළ රත් හඳුන්, සුදු හඳුන් වැනි ශාක පවතින අතර මෙම වර්ෂය තුළ දී පලොල්, හීං අරත්ත, නික, ඇඹුල් දොඩම්, ඉහුරු සහ කහ වැනි භෝග අළුතින් වගා කර ඇත.






- **දංගොල්ල ඔසු උයන**

  අක්කර 35කින සමන්විත වන මෙම ඔසු උයනෙහි අරළු, බුළු, නෙල්ලි, බෙලි, පලොල්, ඇඹුල් දොඩම් සහ දෙහි වැනි දීර්ඝ කාලීන භෝග මෙන්ම ඉරිමේදාදිය, උඳු, පුහුල් සහ කිරාත වැනි කෙටි කාලීන භෝග ද වගා කර ඇත.

  මෙම ඔසු උයනේ කාර්යාලීය හ නඩත්තු කටයුතු සඳහා ස්ථීර හෝ තාවකාලික ඉදිකිරීමක් නොමැති බැවින් සකසන ලද බහාලුම් පෙට්ටියක් 2021 වර්ෂයේ දී ලබා දී ඇත. එමෙන්ම වගා කටයුතු සඳහා ලබා ගැනීමට 3000L ධාරිතාවයෙන් යුතු ජල බවුසරයක් මෙම වර්ෂය තුළදී ලබා දී ඇත.








- **මැදවච්චිය ඔසු උයන**

  අක්කර 5.5ක වපසරියක් ඇති මෙම ඔසු උයනෙහි පවතින ඖෂධීය ශාක වලට අමතරව කුඹුක්, මී පැළ, බුළු, ඇඹුල් දොඩම්, නෙල්ලි, ඇහැළ සහ නා යනාදී පැළ 125ක් පමණ 2021 වර්ෂය තුළ දී රෝපණය කර ඇත.





16. නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීම

ප්‍රාග්ධන ව්‍යාපෘති

- 600 Liters Stainless Steel Cosmetics Mixing Machine.

නව නිෂ්පාදන අතර Veniwel Body Wash, Perfect glow වැනි නිෂ්පාදන සඳහා වෙළඳපල තුළ විශාල ඉල්ලුමක් පවති. එම ඉල්ලුමට සරිලන සැපයුමක් සිදු කිරීම සඳහා ධාරිතාවය පුළුල් කිරීමට 600 Liters Stainless Steel Cosmetics Mixing යන්ත්‍රය 2021 වර්ෂයේ දී මිලදි ගෙන පතිරගොඩ පිහිටි නව නිෂ්පාදනාගාරයේ ස්ථාපිත කරන ලදී. මෙම යන්ත්‍රය මඟින් ඒකවර වැඩපත් 5ක් කාර්යක්ෂමව නිෂ්පාදනය කල හැකි අතර ඒ සඳහා සිදු කර ඇති ආයෝජනය රු.මි. 2.64කි.



17. නව නිෂ්පාදන හඳුන්වාදීම සහ අලෙවි ප්‍රවර්ධනය

- **නව නිෂ්පාදන හඳුන්වා දීම**

දශක කිහිපයක සිට ශ්‍රී ලංකාව තුළ පවත්නා බෝ නොවන රෝගයක් වන මුඛ පිළිකා ඇති වීම සඳහා හුණු, දුම්කොළ සහිත බුලත් විට සැපීම හේතු වී ඇත. ඒ සම්බන්ධයෙන් ජාතික දුම්කොළ හා මධ්‍යසාර අධිකාරිය විසින් සිදු කරන ලද පර්යේෂණයක ප්‍රතිඵලයක් වශයෙන් ඔසු විටක් හඳුන්වා දී ඇත. එය ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් ''බුලත් සැපේ'' වෙළඳ නාමය යටතේ වෙළඳපලට හඳුන්වා දීම 2021 මාර්තු මස 26 වන දින සිදු කරන ලදි.

මෙම හඳුන්වාදීමේ උත්සවය ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සහ ජාතික දුම්කොළ හා මධ්‍යසාර අධිකාරිය එක්ව සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය සහ දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය ගරු සිසිර ජයකොඩි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී ලබන්වන ලදි.





- **නව අලෙවි ශාඛා පිහිටු වීම**
  - *** නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය**

රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවේ ව්‍යාපෘතියක් ලෙස ඉදිකරන ලද නාරහෙන්පිට '' රජවාස '' අලෙවි සංකීර්ණය, රජය සහ රජයට අනුබද්ධිත වෙළඳ ආයතන එක් වහලක් යටට ගැනීමේ අරමුණ පෙරදැරිව ආරම්භ කරන ලදී. එහි සංස්ථාව වෙත ද අලෙවි කුටියක් වෙන්කර ඇති අතර එහි 2021 වර්ෂයේදී සංස්ථාව විසින් නව අලෙවි ශාඛාව පිහිටු වන ලදි.





* **ඇඹිලිපිටිය අලෙවි මධ්‍යස්ථානය**

සංස්ථාවේ අලෙවි ජාලය පුළුල් කිරීම සහ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය රැස් කිරීම අරමුණ කර ගනිමින් මෙම අලෙවි ශාඛාව ආරම්භ කරන ලදී. සබරගමු පළාතේ පවත්නා වාණිජ නගරයක් වන ඇඹිලිපිටිය නගරය අමුද්‍රව්‍ය බහුලව හුවමාරු වන ප්‍රදේශයකි. එමෙන්ම සායනික සේවා ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිතව ඇත.





- **අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ නිමි ඖෂධ අලෙවිය වර්ධනය කර ගැනීම සඳහා දිවයින පුරා පවතින රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල පවත්වන ලද අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පහත පරිදි වේ.

වැඩසටහන පැවැත්වූ මාසය	පැවැත් වූ ආයතනය / ස්ථානය
ජනවාරි	උඟව පළාත් සභාව
ජනවාරි	නගර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන (ගොඩකවෙල)
පෙබරවාරි	උඟව පළාත් සභාව
පෙබරවාරි	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය -මොණරාගල
මාර්තු	උඟව පළාත් සභාව
අප්‍රේල්	නිල්මා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන (මහරගම,කොටුව,ගාල්ල,සහ රත්නපුර නගර තුල)
අප්‍රේල්	Made In Sri Lanka වැඩසටහන - අනුරාධපුර
අප්‍රේල්	මාතලේ නගර ප්‍රවර්ධන වැඩසටහන
මැයි	කුරුවිට හයිඩ්‍රාමනී ආයතනය
මැයි	කුරුවිට හයිඩ්‍රාමනී ආයතනය
ජූලි	මහනුවර උසාවි සංකීර්ණය
ඔක්තෝබර්	ස්ථානීය අලෙවි ප්‍රවර්ධනය - නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය
නොවැම්බර්	ස්ථානීය අලෙවි ප්‍රවර්ධනය - නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය
දෙසැම්බර්	ස්ථානීය අලෙවි ප්‍රවර්ධනය - නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය

* නිල්මා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

මහරගම



රත්නපුර



පිටකොටුව





ගාල්ල





- **අලෙවිය හා සම්බන්ධ සේවකයන් ඇගයීමේ වැඩටහන්**

අලෙවි කටයුතු වල නියැලෙන සේවක මහත්ම මහත්මින් දිරි ගැන්වීම සඳහා ඔවුන්ගේ ප්‍රගතිය සමාලෝචනයට ලක් කරමින් හොඳම අලෙවි මධ්‍යස්ථාන 03 තෝරා එහි ස්ථානභාර නිලධාරින්හට තෑගි ලබා දීම 2021 වර්ෂයේදී සිදු කර ඇත.





14. විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව 2021 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පවත්වා ඇති අතර, එහිදී විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන විමසුම්ද, අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරනු ලබන විගණන විමසුම්ද සාකච්ඡා කර එහි දක්වා ඇති කරුණු නිවැරැදි කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් සිදුකරනු ලැබේ.

මෙයට අමතරව දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ මට්ටමින් විගණන හා කළමනාකරණ රැස්වීම් මාස 03 කට වරක් පවත්වන අතර, එහිදී ද විගණන විමසුම් වලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියද සලකා බලන ලදී.
2021 වර්ෂයේ සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික මණ්ඩලයේ විස්තර පහත දැක්වේ.

1.	එම්. එච්. එන්. සමීල් මහතා	-	භාණ්ඩාගාර නියෝජිත (2021.01.29 සිට 2021.06.27)
2.	ආර්. කොළඹගේ මහත්මිය	-	භාණ්ඩාගාර නියෝජිත (2021.06.28 සිට)
3.	ගීතාමනි සී. කරුණාරත්න මහත්මිය	-	අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික
4.	ප්‍රදීප්. ඒ. පීරිස් මහතා	-	අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික
5.	ආර්.ජී.ඩී. ප්‍රියදර්ශනී මිය	-	ප්‍රධාන අභ්‍යන්තර විගණක (දේශීයවෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය)
6.	කේ. කන්දගේ මහතා	-	රජයේ විගණන අධිකාරි

15. මූල්‍ය කළමනාකරණය හා විගණන විමසුම් පිළිබඳ අදහස්

සංස්ථාවේ ගිණුම් පද්ධතිය තුළ පවතින විවිධ අඩුපාඩු හා පද්ධති දුර්වලතා පිළිබඳව විගණකාධිපති විසින් වරින් වර විගණන විමසුම් වලින් පෙන්වා දෙනු ලැබේ. මෙයට අමතරව පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවේ ද එම අඩුපාඩු පෙන්වා දුන් අතර, දැනටමත් එම අඩුපාඩු හා දුර්වලතා විගණන හා කළමනාකරණ කමිටුව විසින් දෙනු ලබන උපදෙස් හා මඟ පෙන්වීම් අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග පරිදි අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට 2021 වර්ෂයේදී ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා සිටිමි.

<u>ස්තුතිය</u>

- නිවැරදි මඟ පෙන්වීමක් කළ හිටපු සෞඛ්‍ය අමාත්‍ය නීතිඥ පවිත්‍ර වන්නිආරච්චි මැතිණියටත්, වර්තමාන සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාටත්, දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය ගරු නීතිඥ සිසිර ජයකොඩි මැතිතුමාටත්,
- දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- සංස්ථාවේ ප්‍රාග්ධන හා අයභාර වැඩිදියුණු කිරීම සඳහා සහාය දුන් මහාභාණ්ඩාගාරයටත්,
- නොමද සහාය ලබාදුන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වත්මන් ආයුර්වේද කොමසාරිස් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- නිමි ඖෂධ මිලදී ගැනීමට සහාය දැක්වූ පළාත් සභා, පළාත්පාලන සහ ප්‍රාදේශීය සභා මෙන්ම අලෙවි නියෝජිතයින්ටත්,
- පද්ධති පාලනයේ දුර්වලතා හා වැරදි අත්හැරීම් නිවැරදි කර ගැනීමට මහපෙන්වීමක් කළ විගණකාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ කටයුතු ඉදිරියට ගෙනයාම සඳහා ප්‍රශංසනීය සහයෝගයක් ලබාදුන් සංස්ථාවේ කළමනාකාරීත්වයට හා සේවක මණ්ඩලයටත් මාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනමමු.



නීතිඥ සාගලා අභයවික්‍රම
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ආයතනික පාලන වාර්තාව

ආයතනික පාලනය යනු ඉහළ විනිවිදභාවය, නිරවද්‍ය හා කාලීන මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කිරීම මඟින් ආයතනයට සම්බන්ධ පාර්ශවයන්ගේ (රජය සහ ප්‍රජාව, ආයෝජකයින්, සේවකයින්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින්) අභිමතාර්ථ සාධනය උදෙසා කළමනාකරණය විසින් ආයතන අධ්‍යක්ෂණය සහ පාලනය කරන ක්‍රම පිළිවෙලයි.

සංස්ථාපිත පාලන සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ.

- **අධ්‍යක්ෂ මණ්ඩලය**

අධ්‍යක්ෂ මණ්ඩලය, නිෂ්පාදනය, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය හා ආශ්‍රිත සේවා, අලෙවිකරණය, රාජ්‍ය මූල්‍ය හා පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි ව්‍යාප්තිමය සහ අත්දැකීම් බහුල පුද්ගලයන්ගෙන් සැදුම් ලබයි.

විධායක අධ්‍යක්ෂවරයෙකු වන සභාපතිවරයා සහ කළමණාකාර අධ්‍යක්ෂවරයෙකුගෙන් සහ විධායක නොවන අධ්‍යක්ෂවරු පස් දෙනෙකු ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවකදී හෝ ගරු ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොමැති විටකදී හැර අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වේ. අවශ්‍ය විටකදී විශේෂ රැස්වීමක් පැවැත් වීමටද කටයුතු කරනු ලැබේ.

- **කළමනාකරණ කමිටුව**

සංස්ථාපිත කළමනාකරණ කමිටුවේ සභාපති තනතුර සංස්ථාවේ සභාපතිවරයා විසින් හොබවනු ලැබේ. අනෙකුත් කමිටු නිළධාරීන් වන්නේ සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ, සාමාන්‍යාධිකාරි, සහකාර සාමාන්‍යාධිකාරිවරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ය.

සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කරන ආකාර, උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම මෙන්ම අවශ්‍ය විටෙක ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සුදුසු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ආදී කටයුතු කළමනාකරණ කමිටුව මඟින් සිදුකෙරේ. කළමනාකරණ කමිටුව මාසිකව රැස්වේ.

- **විගණන කමිටුව**

“ යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ“ සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටු පිහිටුවා ඇත.

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙන අතර සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා කමිටුවේ සභාපති වේ. සංස්ථාවේ කාර්යයන් පරීක්ෂා කිරීම සහ ඇගයීම විගණන කමිටුව විසින් ස්වාධීනව කරනු ලබන අතර අවශ්‍ය අවස්ථා වලදී කළමනාකාරීත්වයට අවශ්‍ය මගපෙන්වීම් සිදු කිරීම. අභ්‍යන්තර විගණන කාර්යයන්, විගණන කමිටුවේ අනුමැතිය මත පිළියෙල කරන අතර අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කෙරෙන කටයුතු විගණකාධිපතිවරයාගේ දැනුවත් වීමට ද යොමු කෙරේ

- **ආයෝජකයන්ගේ සම්බන්ධතා සහ පොදු වගකීම**

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරුවන් ආයතනය පාලනය කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය ලෙස සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයටත්, මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයටත් වගකිව යුතු වේ. මෙම වගකීම සපුරාලමින් වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තු සඳහා ප්‍රගති වාර්තා ආදිය එම ආයතනවලට ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය සම්බන්ධව අවසාන අධිකාරි බලය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සතුව පවතින බැවින් ආයතනයේ ප්‍රගතිය, මූල්‍ය වාර්තා, විගණන වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

ලාභ අරමුණු කර ගත් රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර සඳහා වන පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) වග කියනු ලැබේ.

- **වේතන ප්‍රතිපත්තිය**

සංස්ථාවේ වැටුප් ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් සහ චක්‍රලේඛ මත පිහිටුවා සකසා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල දීමනා, මුදල් අමාත්‍යාංශය මඟින් රාජ්‍ය සංස්ථා වලට අදාළව නිකුත්කර ඇති චක්‍රලේඛ මත පදනම්ව ගෙවනු ලැබේ.

මාසික නිෂ්පාදනය හා සේවක පැමිණීම පාදක කර ගනිමින් නිෂ්පාදන සහ පැමිණීමේ දිරිදීමනා සියලුම සේවකයන් වෙත මාසිකව ගෙවනු ලබයි.

- **අභ්‍යන්තර පාලනය**

ආයතනය විසින් එළඹෙන සියලු ගනුදෙනු සඳහා නියමිත අධිකාරිය ලැබුන බවටත්, සටහන් ගත කිරීම හා වාර්තා කිරීම, නිර්දේශ කිරීම, සහතික කිරීම සහ අනුමත කිරීම යන කරුණු සම්බන්ධයෙන් සාධාරණ තහවුරු කිරීමක් ඇතිවන පරිදි අභ්‍යන්තර පාලනය සැලසුම කොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

කාර්යයන් මත පදනම් වූ ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක වේ. නියමිත කාර්යයන් අනුව දෙපාර්තමේන්තු සැලසුම් කර ඇති අතර ඒවා නිෂ්පාදන, තත්ත්ව පාලන, නඩත්තු, මුල්‍ය, සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන, අලෙවිකරණ ආදී වශයෙන් වෙති.

කළමනාකාර අධ්‍යක්ෂක සහ සාමාන්‍යාධිකාරි, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. සංස්ථාව ප්‍රධාන විධායක නිලධාරී වන සාමාන්‍යාධිකාරි වෙත එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඍජුවම වාර්තා කරයි.

අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය තහවුරු කර ඇති අතර අභ්‍යන්තර විගණක ඍජුවම සභාපතිවරයාට සහ විගණන කමිටුවට වාර්තා කිරීම මඟින් අභ්‍යන්තර පාලනය තව දුරටත් ශක්තිමත් කෙරේ. රජයේ විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික විගණන වාර්තාව මත පදනම්ව ඒ ඒ අංශවල පවත්නා දුර්වලතා මඟහරවා ගැනීමට, සභාපති ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලය සහ විගණන කමිටුවේ අවශ්‍ය මගපෙන්වීම් සිදු කරනු ලබයි.

මිලදී ගැනීමේ ක්‍රියාවලිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන සහ ඒ හා සම්බන්ධ චක්‍රලේඛන මත පදනම්ව සිදු කෙරෙන අතර ගණුදෙනු වල විනිවිදභාවය තහවුරු කිරීමට ඒ ඒ මිලදී ගැනීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර ඇත.

අපේක්ෂිත අදායම්, පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් ඇතුළත් වාර්ෂික අයවැය ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර රේඛීය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. MED/A/ADC/FA/21/04 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 සැප්තැම්බර් 30 දින

සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 51 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශවල අගයන් ආසන්නතම රුපියලට වටයා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පහත සඳහන් නිරීක්ෂණවලට අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ඉතිරි තොගවල අගය රු.323,564,606 ක්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 හි සඳහන් නියමයන්ට අනුකූලව හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(i) සංස්ථාවේ ගබඩා 03 ක සහ දිවයින පුරා පිහිටි ඖෂධ අලෙවිසැල් 19 ක පැවැති නිමි ඖෂධ තොගවල පිරිවැය ගණනය කිරීම සඳහා ප්‍රමිතයේ 25 ඡේදයේ දැක්වෙන නියමයන්ට අනුකූලව පවත්වා තිබුණු තොග ලෙජර යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට නිමි ඖෂධ ඉතිරි තොගවල සත්‍ය පිරිවැය ගණනය කළ නොහැකිවී තිබුණි. ඒ හේතුවෙන් පවත්වා තිබුණු තොග ලෙජරයේ දැක්වෙන ඉතිරි ඒකක සංඛ්‍යාව ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැයකින් වැඩිකර 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ තොගයේ අගය රු.129,032,821 ක් ලෙස ගණනය කර ගිණුම් ගත කර තිබුණි. එසේම නිමි ඖෂධ ගබඩාවල ඉතිරිව තිබුණු ඖෂධ බෝතල් 38,868 ක ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය රු.4,417,736 ක් හා ඖෂධ වර්ග 10 කට අදාළ ඖෂධ ඒකක 5,499 ක පිරිවැය 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගයේ අගයට ඇතුළත් කර නොතිබුණි.

(ii) කල් ඉකුත් වූ නිමි ඖෂධ 04 කට අදාළ ඖෂධ ඒකක 1,623 ක පිරිවැය ගණනය කර හානි වූ හා කල් ඉකුත් වූ නිමි ඖෂධ තොගයට ඇතුළත් කර නොතිබුණු අතර ඔසු අමු ද්‍රව්‍යවලට හා ඇසුරුම් ද්‍රව්‍යවලට අදාළ හානි වූ තොගවල පිරිවැය ගණනය කර ගිණුම් ගත කරද නොතිබුණි.

(iii) ඔසු අමු ද්‍රව්‍ය ගබඩා 05 ක, නිමි ඖෂධ ගබඩා 03 ක, ඇසුරුම්ද්‍රව්‍ය ගබඩා 03 ක හා නිමි ඖෂධ අලෙවි සැල් 12 ක භෞතික තොග සත්‍යාපනය 2021 දෙසැම්බර් 31 දිනට පෙර හා පසු සිදුකර තිබුණු බැවින් අවශ්‍ය ගැලපීම් සිදුකර 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොග ප්‍රමාණය නිවැරදිව ගණනය කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. යාපනය, බේරුවල හා විජේරාම අලෙවිසැල්වල භෞතික තොග සත්‍යාපනය මගින් අනාවරණයවී තිබුණු පිරිවැය රු.8,127,355 ක නිමි ඖෂධවල, පිරිවැය රු.1,262,938 ක ඔසු අමුද්‍රව්‍ය 16 ක හා පිරිවැය ගණනය නොකළ භෞතික ශේෂය කිලෝග්‍රෑම් 2,734 ක් වූ ඔසු අමුද්‍රව්‍ය 02 ක තොග ඌනතා සහ පිරිවැය රු.2,425,139 ක් වූ ඔසු අමුද්‍රව්‍ය 29 ක තොග අතිරික්තතා 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගවලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(iv) ලිපි ද්‍රව්‍ය තොග ලෙජර ගිණුම් යාවත්කාලීන කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ සත්‍ය ලිපි ද්‍රව්‍ය පාරිභෝජනය වූ අයිතම 512 කට අයත් ලිපිද්‍රව්‍ය ඒකක 525,293 ක සත්‍ය පිරිවැය හා 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි ලිපිද්‍රව්‍ය තොගයේ සත්‍ය පිරිවැය ගණනය කළ නොහැකිවී තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි ලිපිද්‍රව්‍ය තොගයේ පිරිවැය රු.3,431,501 කට සමාලෝචිත වර්ෂය තුළදී ලිපිද්‍රව්‍ය ගැනුම් පිරිවැය රු.1,743,072 ක් එකතු කළ අගය රු.5,174,573 ක් වුවද, එම අගය ඉක්මවා 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි ලිපිද්‍රව්‍ය තොගයේ පිරිවැය රු.6,346,167 ක් ලෙස ගණනය කර ගිණුම්ගත කර තිබීම හේතුවෙන් රු.1,171,594 ක් රඳවාගත් ලාභයට එකතුකර දක්වා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි ලිපිද්‍රව්‍ය තොගයේ පිරිවැය රු.6,346,167 ක් ලෙස ගණනය කිරීමේදී, ඉතිරි ලිපිද්‍රව්‍ය තොග අයිතම 45 කට අදාළ ලිපිද්‍රව්‍ය ඒකක 23,459 ක සත්‍ය පිරිවැය හඳුනා නොගෙන ඒකකයක් රුපියල බැගින් අගය කර ගිණුම්ගත කර තිබුණු බවත්, භෞතික ශේෂයක් නොතිබුණු ලිපිද්‍රව්‍ය ඒකක 02 ක පිරිවැය රු.6,500 ක් ඉතිරි තොගයේ පිරිවැයට ඇතුළත් කර තිබුණු බවත්, ලිපිද්‍රව්‍ය ඒකක 2,041 ක පිරිවැය තොගයට ඇතුළත් කර නොතිබුණු බවත්, අයිතම 06 කට අදාළ භාවිතයට ගත නොහැකි ලිපිද්‍රව්‍ය ඒකක 57 ක පිරිවැය ගණනය කර කපාහැරීමට කටයුතු කර නොතිබුණු බවත් වැඩිදුරටත් අනාවරණය විය.

(v) ප්‍රමිතයේ 28 ඡේදය ප්‍රකාරව, රස ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා රත්‍රංවල 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගයේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් අඩු අගය ගිණුම්ගත කළ යුතු වුවද, ඊට පටහැනිව කටයුතු කරමින් ඒවායේ වෙළඳපල වටිනාකම රු.15,400,257 ක් ලෙස තක්සේරු කර ගිණුම්ගත කර තිබුණු අතර ජංගම නොවන වත්කමක් ප්‍රත්‍යාගණනය කළ ලෙස සලකා රු.4,341, 879 ක අතිරික්තයක් හඳුනාගෙන ප්‍රත්‍යාගණන සංචිතයට එකතුකර දක්වා තිබුණි. තවද, ඉකුත් වසර ගණනාවක් තිස්සේ මෙම ක්‍රමය අනුගමනය කර තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.13,558,612 ක ප්‍රත්‍යාගණන සංචිතයක් හඳුනාගෙන තිබුණි.

(ඇ) 2021 ජනවාරි 01 දිනට රු.113,965,665 ක් වූ ණයගැති ශේෂයෙන් සියයට 97 ක් හෙවත් රු.111,006,467 ක් සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගෙන තිබුණු නමුත් වර්ෂ 05 කටත් පෙර සිට හිඟව පැවැති රු.2,539,237 ක් වූ ණයගැති ශේෂය අයකර ගැනීමට නොහැකිවී තිබුණි. ඒ පිළිඳව නොසලකා රු.287,682 ක් හෙවත් 2021 දෙසැම්බර් 31 දිනට ණයගැතියන් ගෙන් සියයට 0.25 ක් පමණක් අඩමාන ණය සඳහා වෙන්කර තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 14(ආ) ඡේදය ප්‍රකාරව, අස්ථිත්වයක මූල්‍ය ප්‍රකාශනවලින් වඩාත් විශ්වාසදායි තොරතුරු සැපයීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි වුවද, අවදානමට සාපේක්ෂව අඩමාන ණය සඳහා වෙන්කිරීමේ ප්‍රතිපත්තිය වෙනස් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 14(අ) හා (ආ) ඡේදවල දැක්වෙන කොන්දේසිවලට පටහැනිව ඉකුත් වර්ෂයේ අනුගමනය කළ තොග ආගණන ප්‍රතිපත්තිය සමාලෝචිත වර්ෂයේදී වෙනස් කර තිබුණි. තවද, ඖෂධ අලෙවි සැල්වල නිමි ඖෂධ තොග ලෙජර ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමයට පවත්වා තිබුණු නමුත් ඉතිරි නිමි ඖෂධ තොග හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය පදනම් කරගෙන ගණනය කර ගිණුම්ගත කළ බවට වූ සාවද්‍ය ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෙළිදරව් කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.36,631,967 ක් වූ වාහන 14 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව, ආයු ගණක ක්‍රමය (Actuarial method) භාවිතා කරමින් වෘත්තීය ගිණුම්කරණ ආයතනයක් විසින් සිදුකර තිබුණු ගණනය කිරීම් අනුව 2018 දෙසැම්බර් 31 දිනට නිරත සේවකයින් 383 දෙනෙකු පදනම් කරගෙන රු.40,174,665 ක් පාරිතෝෂික සඳහා වෙන්කර තිබුණු නමුත් ඉන් පසු වෙනත් ක්‍රම අනුගමනය කර තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට වෙන්කර තිබුණු රු.16,950,449 ක් ඉක්මවා රු.6,883,348 ක් පාරිතෝෂික දීමනා ලෙස ගෙවීමට සිදුව තිබුණි. තවද, වර්ෂයක සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබුණු සමාලෝචිත වර්ෂයේදී සේවයට බඳවා ගෙන තිබුණු සේවකයින් 32 දෙනෙකු වෙනුවෙන් විශ්‍රාම පාරිතෝෂික ලෙස රු.649,488 ක් වෙන් කර තිබුණි.

(උ) 2021 දෙසැම්බර් 31 දිනට හානි වූ හා කල් ඉකුත් වූ නිමි ඖෂධ ඒකක 133,873 ක ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය රු.3,287,068 ක් විය. නමුත් එදිනට හානි වූ තොග සඳහා වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු.4,343,168 ක් වූයෙන් රු.1,056,100 ක අධි වෙන් කිරීම සමාලෝචිත වර්ෂයේ ලාභයට හඳුනාගත යුතු වුවද, ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඌ) ඔසු උයන්වලින් සපයා ගනු ලබන වියලි ඔසු අමුද්‍රව්‍යවල පිරිවැය හඳුනාගැනීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඔසු උයන්වලින් ලැබී තිබුණු වියලි ඔසු අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 4,367 ක් සහ අමු ඔසු අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 9,113 ක් කිලෝග්‍රෑමයක් රු.1 බැගින්ද, අමු ඔසු අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 5,261 ක් පවත්නා වෙළඳපල මිල යටතේ රු.1,076,526 කටද වශයෙන් රු.1,090,006 කට අගය කර ඔසු උයන් ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(එ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ වර්ෂ 05 සඳහා ඉන්වොයිස් ලැබී තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් මුදලින් පියවා නොතිබුණු විගණන ගාස්තු රු.6,001,200 ක් විය. 2021 වර්ෂය වෙනුවෙන් වෙන්කර තිබුණු රු.1,200,000 ක් සමඟ එදිනට ගෙවිය යුතු මුළු විගණන ගාස්තු රු.7,201,200 ක් වුවද එදිනට රු.2,443,260 ක් පමණක් වෙන්කර තිබුණු බැවින් ඌන වෙන්කිරීම රු.4,757,940 ක් විය.

(ඒ) අත්තිකාරම් වවුචරයක් මගින් සැපයුම්කරුවන්ට අත්තිකාරම් ගෙවා පසුව අත්තිකාරම පියවමින් ඉතිරි මුදල ගෙවීමට ගෙවීම් වවුචරයක් පිළියෙල කර මුළු වියදම ගිණුම්ගත කළ යුතු වුවද, ගෙවීම් වවුචර පිළියෙල නොකර ජර්නල් සටහන් 138 ක් මගින් රු.56,881,303 ක අත්තිකාරම් පියවා තිබුණි. තවද එම ජර්නල් සටහන් සඳහා පිළියෙල කර තිබුණු ජර්නල් වවුචර් 138 ක් හා 2021 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල වැරදි නිවැරදි කිරීමට හා ගැලැපීම් සිදුකිරීමට පිළියෙල කර තිබුණු රු.1,028,672,220 ක් වූ ජර්නල් වවුචර් 950 ක් වගකිව යුතු නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු නිෂ්පාදන ගිණුමට අනුව නිෂ්පාදන පිරිවැය රු.630,629,340 ක් වුවද, පිළියෙල කර තිබුණු නිෂ්පාදන පිරිවැය වාර්තාව අනුව ඇස්තමේන්තු ගත ඒකක නිෂ්පාදන පිරිවැය මත ගණනය කරන ලද මුළු නිෂ්පාදන පිරිවැය රු.496,877,858 ක් වූයෙන් වෙනස රු.133,751,482 ක් විය. මෙම පිරිවැය වෙනස්කම් පිළිබඳ පරීක්ෂාවකින් තොරව නිෂ්පාදන පිරිවැය වාර්තාවේ සඳහන් ඒකක නිෂ්පාදන පිරිවැය පදනම් කර ගනිමින් ඖෂධවල විකුණුම් මිල තීරණය කර තිබුණි.

(ඕ) 2021 දෙසැම්බර් 31 දිනට ණයගැති හා ණයහිමි ශේෂ පිළිවෙලින් රු.109,665,691 ක් හා රු.77,871,755 ක් වුවද, එදිනට පිළියෙල කර තිබුණු ණයගැති හා ණයහිමි කාල විශ්ලේෂණ අනුව ශේෂ පිළිවෙලින් රු.115,694,386 ක් හා රු.76,236,566 ක් වූයෙන් වෙනස පිළිවෙලින් රු.6,028,695 ක් හා රු.1,635,462 ක් විය. මෙම වෙනස්කම්වලට හේතු ඉදිරිපත් නොකෙරුණි.

(ක) 2021 දෙසැම්බර් 31 දිනට රු.109,665,691 ක් වූ ණයගැති ශේෂ 73 කින් රු.106,667,889 ක් වූ ශේෂ 43 කට අදාළ ණයගැතියන් වෙත පමණක් ශේෂ සනාථන ලිපි යවා තිබුණි. ඉන් රු.83,038,311 ක් වූ ශේෂ 33 ක් තහවුරු කර නොතිබුණි. ණයගැති ශේෂ 06 ක පොත් අගය රු.13,566,348 ක් වුවද, ලැබී තිබුණු ශේෂ සනාථන ලිපිවලට අනුව එම ශේෂය රු.10,739,172 ක් වූ අතර තහවුරු නොවූ ශේෂය රු.2,827,176 ක් විය. ඒ අනුව රු.88,863,289 ක් වූ ණයගැති ශේෂ 69 ක් ශේෂ සනාථන මගින් තහවුරුවී නොතිබුණි.

(ග) 2021 දෙසැම්බර් 31 දිනට රු.77,871,755 ක් වූ ණයහිමි ශේෂ 155 කින් රු.51,968,344 ක් වූ ශේෂ 86 කට පමණක් ශේෂ සනාථන ලිපි යවා තිබුණි. ඉන් රු.1,338,800 ක් වූ ශේෂ 08 කට අදාළ ලිපි ණයහිමියන් වෙත ලැබී නොතිබුණු අතර එම ලිපි ආපසු ලැබී තිබුණි. පිළිතුරු එවා තිබුණු රු.24,083,111 ක ණයහිමි ශේෂ 19 කින් රු.116,965 ක් වූ ණයහිමියන් 02 දෙනෙකු විසින් අයවීමට මුදලක් නොමැති බව තහවුරු කර තිබුණි. තවත් ණයහිමියන් 02 දෙනෙකුට අදාළව පොත් අගය රු.82,842 ක් වුවද, ණයහිමියන් තහවුරුකළ ශේෂය රු.47,088 ක් විය. තවද, ණයහිමියන් 05 දෙනෙකුට අදාළ පොත් අගය රු.4,300,370 ක් වුවද, එම ප්‍රමාණය රු.9,050,143 ක් වන බවට එම ණයහිමියන් තහවුරුකර තිබුණි. ඒ අනුව රු.52,153,455 ක් වූ ණයහිමි ශේෂ 136 ක් ශේෂ සනාථන මගින් තහවුරුවී නොතිබුණි.

(ච) දිරාපත්වීම හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර තිබුණු යතුරු පැදියක් ඇතුලු වාහන 03 ක් සහ සංස්ථාව සතු නොවූ වාහන දෙකක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ලෙස රු.362,000 ක් ගිණුම් ගතකර තිබුණි.

(ඡ) වර්ෂයකටත් වඩා වැඩි කාලයක සිට බැංකු ගිණුම් 03 කට සෘජුවම ලැබී තිබුණු රු.2,052,823 ක් හඳුනාගෙන පොත්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, බැංකු ගිණුම් 02 ක තැන්පත් කර තිබුණු නමුත් උපලබ්ධිවී නොතිබුණු රු.33,592 ක් වටිනා වර්ෂයකටත් වඩා පැරණි චෙක්පත් 05 ක් අදාළ ණයගැතියන්ට හර කර බැංකු ගිණුමට බැර කර නොතිබුණි.

(ට) ඖෂධයේ චූර්ණයට මිශ්‍රකර පුද්ගලික වෛද්‍යවරුන් හා ඖෂධ නිෂ්පාදනාගාර වෙත අලෙවි කරන කංසා කිලෝග්‍රෑම් 01 ක විකුණුම් මිල රු.20,000 ක් විය යුතු බව මිල කමිටුවක් විසින් තීරණය කර තිබුණි. ඒ අනුව විකුණන ලද කංසා කිලෝග්‍රෑම් 199.2 ක විකුණුම් වටිනාකම රු.3,984,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණු නමුත් නොමිලේ ලැබී තිබුණු කංසා කිලෝග්‍රෑම් 01 ක විකුණුම් මිල රු.20,000 ක් ලෙස තීරණය කිරීම සඳහා යොදාගත් පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඩ) අලෙවි අංශයේ විකුණුම් වාර්තා සමඟ මූල්‍ය අංශයේ විකුණුම් වාර්තා සැසඳීමේදී, ණයට විකුණුම් සහ අත්පිට විකුණුම් රු.2,030,444 ක් අඩුවෙන්ද, ජංගම විකුණුම් රු.1,212,278 ක් වැඩියෙන්ද, ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.818,166 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු බව අනාවරණය විය.

(ණ) 2021 දෙසැම්බර් 31 දිනට, රු.21,926,628 ක් වූ නොනිමි තොගයට හා රු.1,059,750 ක් වූ ඉතිරි දැවී තෙල් තොගයට අදාළ භෞතික සමීක්ෂණ වාර්තා, වර්ෂ 04 ක සිට නොවෙනස්ව පවතින ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු රු.15,000,000 ක ණය මුදල පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය ලිපිගොණු, ලංකා බැංකු ණයවර ලිපි ගිණුමේ පවතින රු.19,310,110 ක ශේෂය පරීක්ෂාවට අදාළ තොරතුරු හා රු.636,000,000 ක ඉඩම්වලට අදාළව අයිතිය තහවුරු කරන ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දැක්වෙන (අ), (ආ),(ඇ) හා (ඊ) නිරීක්ෂණ හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධිවිධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 103, 104 සහ 105	❖ මුළු පිරිවැය රු.3,287,068 ක් වූ හානි වූ හා කල් ඉකුත් වූ තොග සහ මුළු පිරිවැය රු.9,390,293 ක් වූ තොග ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

		❖ බිල්පත් වංචනික ලෙස වෙනස් කිරීම හා අඩුවෙන් ගණනය කිරීම, ඖෂධ ලැබීම් හා නිකුත් කිරීම් වංචා සහගතව තොග ලෙජරයට ඇතුළත් කිරීම හා අලෙවියෙන් ලද මුදල් අඩුවෙන් බැංකු ගත කිරීම මඟින් සංස්ථාවේ අලෙවි මධ්‍යස්ථාන දෙකක සිදුවී තිබුණු රු.4,275,076 ක මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 371 (2) හා (5) සහ 2015 ජූලි 14 දිනැති අංක 03 / 2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	නිකුත් කරන අතුරු අග්‍රිමයක වියදම් නොවී ඉතිරි වන ශේෂය එම අග්‍රිමය නිකුත් කරන මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවිය යුතු වුවද, නිලධාරීන් 28 දෙනෙකු වෙත නිකුත්කර තිබුණු එකතුව රු.337,549 ක අතුරු අග්‍රිම 28 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට පියවා නොතිබුණි. තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යයට ආසන්න දිනයකදී නිකුත් කර එම කාර්යය නිමකළ වහාම හෝ දින 10 ක් ඇතුළත පියවා ගත යුතු වුවද, නිලධාරීන් 27 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු රු.2,344,700 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 148 ක් දින 11 ත් දින 367 ත් අතර කාල පරාසයක් ප්‍රමාදවී පියවා තිබුණි.
	(iii) මුදල් රෙගුලාසි 770(4)	පිරිවැය රු 1,935,000 ක් වූ වාහන 07 ක් භාවිතයෙන් ඉවත්කර තිබුණු නමුත් ඒවා විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි.
(ආ)	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 (අ), (ඇ) සහ (ඈ) ඡේද	සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා දැනට සිටින කාර්ය මණ්ඩලය, අයවැය ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම, කාල රාමුව හා අපේක්ෂිත නිමවුම ඇතුළත් කර නොතිබුණි. තවද, භාණ්ඩාගාර ප්‍රතිපාදන සහිත ප්‍රාග්ධන ක්‍රියාකාරකම් පමණක් ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සැලසුම යටතේ ඇතුළත් කර තිබුණු අතර සංස්ථාවේ අරමුදලින් ඉටුකර තිබුණු රු.40,867,359 ක ප්‍රාග්ධන ක්‍රියාකාරකම් එයට ඇතුළත් කර නොතිබුණි.
(ඇ)	1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ	සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදන දිරි දීමනා රු.52,781,881 ක්, පැමිණීමේ දීමනා රු.5,987,000 ක්, ඵලදායිතා දීමනා රු.12,392,750 ක්ද වශයෙන් එකතුව රු.71,161,631 ක්ද ඇතුළුව පසුගිය වර්ෂ 07 කදී රු.546,141,514 ක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව දිරි දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ

අවම වශයෙන් වර්ෂ 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ලංසු විවෘත කිරීමේ කමිටුව ප්‍රසම්පාදන කමිටුව විසින් විධිමත්ව පත්කර නොතිබීම, නියමිත වේලාව පසුවී ටෙන්ඩරය විවෘත කර තිබීම, නියමිත වේලාවෙන් පසුව ලැබුණු ටෙන්ඩර් අයදුම්පත් 05 ක් භාරගැනීම, විධිමත්ව ලංසු විවෘත කිරීමේ වාර්තා පවත්වා නොතිබීම, සැපයුම්කරුවන් 04 දෙනෙකුගෙන් ප්‍රමාණවත් ලංසු සුරක්ෂණ ලබාගෙන නොතිබීම, අසම්පූර්ණ ලංසු අයදුම්පත් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවෙකුට කාර්යයසාධන ඇපකරයද නොමැතිව කොන්ත්‍රාත්ත් වටිනාකම රු.2,511,343 ක් වූ ටෙන්ඩර් ප්‍රදානය කර තිබීම, සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් ප්‍රමාදවී කාර්යයසාධන ඇපකර ලබා ගෙන තිබීම, ටෙන්ඩර් වටිනාකම් සම්බන්ධයෙන් සැපයුම්කරුවන් සමඟ විධිමත් ගිවිසුම් අත්සන් කර නොතිබීම යන අඩුපාඩු පැවති බව වැඩපත් වර්ග 28 කට අදාළ අමු ඖෂධ මිලදී ගැනීමට අදාළ රු.22,268,024 ක් වූ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. තවද විෂය විශේෂඥයින් විසින් පිළියෙළ කරන පිරිවැය ඇස්තමේන්තුවක් පදනම් කර ගෙන මිල ගණන් සැසඳීමක් සිදුකරමින් මිල ගණන් ඇගයීම් කර නොතිබීම හා වැඩපත්වල අඩංගු ඖෂධ වර්ගවල කේවල මිල ගණන් අනුව ඇගයීම් නොකර වැඩපතේ මිල එකතුව ඉකුත් වර්ෂය සමඟ සසඳා තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් ඇගයීම් කර තිබීම හේතුවෙන් ඇතැම් වැඩපත්වල ඖෂධ සැපයුම් මිල ගණන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 25 සිට සියයට 118 දක්වා වැඩිවී තිබුණු බවද නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ නිෂ්පාදන සඳහා බහුලව භාවිතා කරන තලතෙල් මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1702/5 හා 2011 අප්‍රේල් 20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 05 වන උපලේඛනය ප්‍රකාරව, ආයුර්වේද කොමසාරිස් නිකුත් කරන සහතිකයක් මත ආයුර්වේද සංස්ථාවට පමණක් රේගු තීරුබදු නිදහස් ආනයන යටතේ සංස්ථා නිෂ්පාදන සඳහා තලතෙල් ඇතුළු ඔසු අමුද්‍රව්‍ය කිහිපයක් සෘජුව ආනයනය කිරීමට හැකියාව තිබුණු නමුත් එසේ කටයුතු නොකර තලතෙල් ආනයනය කර සැපයීම් කරන පෞද්ගලික සැපයුම්කරුවන්ගෙන් සාපේක්ෂව වැඩි මිලට තලතෙල් මිලදී ගෙන තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී සංස්ථාව රු.153,353,412 ක තලතෙල් මිලදී ගෙන තිබුණු අතර කිලෝග්‍රෑම් එකක ගත් මිල රු.370 ත් රු.750 ත් අතර පරාසයක පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා තලතෙල් සැපයුම්කරුවන් 20 දෙනෙකුගෙන් මිල ගණන් කැඳවූ බවට සටහන් යොදා තිබුණු නමුත් ඒ බව සනාථ කළ හැකි ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. 2020 වර්ෂයේ අවස්ථා 04 කදී මිල ගණන් කැඳවා සැපයුම්කරුවන් 03 දෙනෙකුගෙන් විවිධ මිල ගණන් 05 ක් යටතේ රු.35,277,148 කට තලතෙල් කිලෝ ග්‍රෑම් 71,660.5 ක්ද 2021 වර්ෂයේ අවස්ථා 03 කදී මිල ගණන් කැඳවා සැපයුම්කරුවන් 02 දෙනෙකුගෙන් විවිධ මිල ගණන් 05 ක් යටතේ රු.58,458,394 කට තලතෙල් කිලෝ ග්‍රෑම් 86,590.5 ක්ද මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව විධිමත් පරිදි ප්‍රතිග්‍රහන ලිපි නිකුත් නොකිරීම, කාර්යය සාධන ඇප මුදල් ලබා නොගැනීම හා කිසිදු සැපයුම්කරුවකු සමඟ ගිවිසුමකට එළඹ නොතිබීම වැනි අවිධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයන් යටතේ එම මිලදී ගැනීම් සිදුකර තිබුණි. සැපයුම්කරුවන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබීමෙන් එකඟ වූ පරිදි තොග නොසැපයීම, තොග ප්‍රමාදය, සැපයීම පැහැර හැරීම හා මිල වැඩි කිරීම යනාදී හේතූන් මත අවස්ථා කිහිපයකදීම නිෂ්පාදනය ප්‍රමාදවීම හා ඇනහිටීම සිදුව තිබුණු නමුත් අදාළ සැපයුම්කරුවන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට සංස්ථාවට නොහැකිව තිබුණු අතර අසාදු ලේඛනගත කළ යුතු එවැනි සැපයුම්කරුවන් වෙත නැවත ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි.

3. වෙනත් කරුණු

(අ) නිෂ්පාදිත ඖෂධ වර්ගය මත බර තැබීමක් කරමින් අදාළ නිෂ්පාදන ඒකක ප්‍රමාණයේ වැඩිවීම් මත ගණනය කරන දිරි දීමනාවක් නිෂ්පාදන කටයුතු සඳහා සෘජු දායකත්වයක් සපයන සේවකයින් සඳහා ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනයේ ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමට හැකි වන නමුත් එවැනි ක්‍රමයක් වෙනුවට රු. මිලියන 15 ඉක්මවා වැඩිවන මාසික නිෂ්පාදන පිරිවැය මත පදනම්ව සංස්ථාවේ සියළුම අංශවල සේවකයන්ට මාසිකව රු.මිලියන 03 ත් රු.මිලියන 07 ත් අතර මුදලක් නිෂ්පාදන දිරිදීමනා වශයෙන් ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයේ රු.33,597,472 ක් වූ මෙම දිරිදීමනා වියදම සමාලෝචිත වර්ෂයේදී රු.52,781,881 ක් දක්වා සියයට 57 කින් වැඩිවී තිබුණු අතර නිෂ්පාදන පිරිවැය ඉහළ යන අවස්ථාවලදී සංස්ථාවේ ලාභදායිත්වය අඩු වුවද ගෙවන නිෂ්පාදන දිරි දීමනාව වැඩි කිරීමට සිදුව තිබුණි.

(ආ) 2017, 2018, 2020 හා 2021 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.මිලියන 102 කින් රු.මිලියන 54.1 ක් හෙවත් සියයට 53 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් උපයෝජනය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.

(ඇ) රෝගීන්ගේ රස බෙහෙත් අවශ්‍යතාවය සපුරාලීමේ හා නිරෝගී සමාජයක් ගොඩනැගීමේ අරමුණින්, රු.මිලියන 38.5 ක ඇස්තමේන්තු පිරිවැයක් සහිත රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම රු.37,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2018 ජූලි 12 දින ආරම්භ කර තිබුණි. 2020 සැප්තැම්බර් 20 වන විට වසර 03 කට අධික කාලයක් ගතව තිබුණු නමුත් ප්‍රතිපාදනවලින් සියයට 31.4 ක එනම් රු.11,618,072 ක මූල්‍ය ප්‍රගතියක් සහ සියයට 25 ක භෞතික ප්‍රගතියක් පමණක් අත්පත්කර ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව, අරිෂ්ඨ, ආසව, ලේප, ක්වාත, රස, මෝදක, තෛල, සිරප්, වටිකා, ගුගුල්, කල්ක, චූර්ණ, ලේහ යනාදී නිෂ්පාදන 13 ක් යටතේ නිෂ්පාදනය කරන සැලසුම්ගත වාර්ෂික ඖෂධ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 88,931 ක් සහ මිලි ලීටර් 750 බෝතල් 760,364 ක් වුවද, තත්‍ය නිෂ්පාදනය කිලෝග්‍රෑම් 70,081 ක් හා මිලි ලීටර් 750 බෝතල් 482,149 ක් විය. ඒ අනුව අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය පිළිවෙලින් කිලෝග්‍රෑම් 18,850 කින් හා මිලි ලීටර් 750 බෝතල් 278,215 කින් ළඟාකර ගැනීමට නොහැකිවී තිබුණි. වර්ෂය සඳහා නිෂ්පාදන වැඩපත් 2138 ක් සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය වැඩපත් ප්‍රමාණය 1396 ක් වීමෙන් වැඩපත් 742 ක ප්‍රමාණයක් නිමකර ගැනීමට නොහැකිවී තිබීම අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක කරා ළඟා නොවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඉ) සංස්ථාව විසින් අවස්ථා 120 කදී රු.1,534,490 ක් වටිනා ඖෂධ නොමිලේ නිකුත් කර ඒවායේ පිරිවැය රු.579,069 ක් පරිත්‍යාග ලෙස විකුණුම් හා බෙදාහැරීම් වියදම් යටතේ දක්වා තිබුණි. 2019 ජූලි 08 දිනැති අංක 13406 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව විෂයභාර අමාත්‍යවරයාගේ ඉල්ලීමට හැර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගත් රු.10,000 ට වැඩි පරිත්‍යාගවලට අදාළ මුදල් අදාළ නිලධාරීන්ගෙන් අය කළ යුතු වුවද, අවස්ථා 14 කදී රු.10,000 ඉක්මවූ රු.681,680 ක පරිත්‍යාග සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඊ) සංස්ථාව විසින් පිළියෙල කර තිබුණු නිෂ්පාදන සැලැස්ම හා අලෙවි සැලැස්මට අනුව කටයුතු ඉටුකරන සංස්ථාවේ විවිධ අංශවල ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය සඳහා වූ විකුණුම් ආදායම රු.800,223,256 කින් රු.575,874,165 ක් හෙවත් සියයට 72 ක් රාජ්‍ය අංශය මගින් ලැබී තිබුණු අතර ඉන් රු.224,349,091 ක් හෙවත් සියයට 28 ක් පමණක් පෞද්ගලික අංශය මගින් ලැබී තිබුණි. නිරායාසයෙන් ලැබෙන රාජ්‍ය අංශයේ ඉල්ලුම කෙරෙහි ඇති වැඩි නැඹුරුවීමත්, වෙළඳපොළ අවශ්‍යතා නිසි පරිදි හඳුනා නොගැනීමත්, නව අලෙවි ක්‍රම උපායන් භාවිතා නොකිරීම සහ ප්‍රචාරණය ප්‍රමාණවත් නොවීමත් පෞද්ගලික අංශයේ විකුණුම් ආදායම අඩුවීමට හේතුවී තිබුණි.

(ඌ) සංස්ථාව විසින් තම වෙළඳපොල කොටස තීරණය කිරීම සඳහා කාලීනව වෙළඳපොල සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර තරහකාරී ආයතන අතර සංස්ථාවේ වෙළඳපොල කොටස අඩුවීමක් හෝ වැඩිවීමක් සිදුවී තිබේද යන්න පිළිබඳ අවබෝධයක් නොතිබුණි.

(එ) 1969 මැයි 11 දිනැති අංක 14,853/3 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කරන ලද නිවේදනය ප්‍රකාරව, සංස්ථාවේ අරමුණු 07 අතරින් ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වාගෙන යාම, ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීමට මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) ගබඩා තුළ ක්‍රමවත් ලෙස තොග ගබඩාකර නොතිබුණු අතර උපරිම, අවම හා යලි ඇණවුම් තොග මට්ටම් පවත්වා නොතිබුණු බවත්, සෙමින් වලනය වන තොග පැවති නමුත් එම අයිතම හඳුනා ගැනීමට හා අලෙවිය සඳහා අලෙවි ප්‍රවර්ධන උපක්‍රම භාවිතා කර නොතිබුණු බවත්, ඖෂධවල මිල වැඩිවීම, ලේබල් හා ඇසුරුම් බොඳවීම ආදී වූ හේතූන් මත අලෙවියෙන් ඉවත් කර තිබුණු ඖෂධ වර්ග කල් ඉකුත් වූ ඖෂධ සමඟ එකට ගබඩාකර තිබුණු බවත්, එම තොග නැවත ලේබල් කර අලෙවි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන කල් ඉකුත් වීමට ඉඩ හැර තිබුණු බවත්, අලෙවි මධ්‍යස්ථානවල හා ගබඩාවල පවතින කල් ඉකුත් වූ ප්‍රයෝජනයට ගත නොහැකි ඖෂධ වර්ග දීර්ඝ කාලයක සිට තොග පොත්වලින් ඉවත් නොකර සාමාන්‍ය තොග ලෙස ගණනය කර තිබුණු බවත්, අලෙවි මධ්‍යස්ථානවල විශාල ඉඩ ප්‍රමාණයක් ඌන උපයෝජිතව පැවති බවත්, නිරීක්ෂණය විය.

(ඔ) අනුරාධපුර පිහිටි ඔසු උයන සංවර්ධනය කර මායිම් වැට ඉදිකිරීම සඳහා රු.1,808,795 ක් වැයකර තිබුණු නමුත් එම ඉඩම විධිමත් පරිදි සංස්ථාවට පවරාගෙන නොතිබුණි.

(ඕ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ක) 2018 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවා ගණ 09 ක් යටතේ සංස්ථාව සඳහා සංශෝධිත බඳවාගැනීම් පටිපාටියක් අනුමත කර තිබුණු නමුත් එම සේවා ගණ යටතට අයත් තනතුරුවලට බඳවාගන්නා ලද සියළුම නිලධාරීන්ට බඳවාගැනීම් පටිපාටියේ සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් පැවැත්වීමකින් තොරව සේවයේ ස්ථීර කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

2021 දෙසැම්බර් මස 31වන දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	31.12.2021	31.12.2020
		රු. ශත.	රු. ශත.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	04	**1,074,320,574.20**	1,087,891,437.12
සිදු කෙරෙමින් පවත්නා කටයුතු	05	**12,144,409.71**	13,953,205.06
කාර්ය මණ්ඩල ණය	06	**15,340,656.57**	13,187,659.62
විලම්බිත බදුකරණය		**1,804,601.00**	1,804,601.00
අනුරාධපුර ඖෂධනෑගිල්ල වසර 5 ගිවිසුම	07	-	497,321.24
		1,103,610,241.48	1,117,334,224.04
ජංගම වත්කම්			
තොග	08	**308,164,348.71**	208,371,166.66
කාර්ය මණ්ඩල ණය	06	**12,600,406.01**	16,419,330.60
රන් තොග		**15,400,257.40**	11,058,378.38
ආන්තික ගිණුම		**19,310,110.51**	21,120,070.62
විවිධ තැන්පතු	09	**3,247,740.00**	2,893,740.00
ස්ථාවර තැන්පතුවල කෙටි කාලීන ආයෝජන	10	**177,860,171.58**	164,512,175.52
වෙළඳ ණයකරුවන්	11	**109,665,691.16**	113,965,665.18
වෙළඳ ණයකරුවන් වෙතින් ලද අතිරේක මුදල්		**273.00**	5,038.00
පෙර ගෙවුම් හා අත්තිකාරම්	12	**19,898,891.06**	17,358,403.94
ඉතුරුම් ගිණුම් - මහජන බැංකුව		**6,291,745.46**	4,210,243.32
මුදල් හා මුදල් සමාන දෑ	13	**95,466,715.11**	132,700,926.86
		767,906,350.00	692,615,139.08
සමස්ත වත්කම්		**1,871,516,591.48**	1,809,949,363.12
අරමුදල් හා වගකීම්			
දායකත්වයන්			
දායක ප්‍රාග්ධනය		**5,000,000.00**	5,000,000.00
		5,000,000.00	5,000,000.00
බාහිර දායකත්ව	14		
මහා භාණ්ඩාගාරය		**320,316,114.38**	317,518,552.85
ලෝක සෞඛ්‍ය සංවිධානය		**3,994,341.00**	3,994,341.00
ආයුර්වේද අත්හදා බැලීමේ ආයතනය		**761,274.00**	761,274.00
		325,071,729.38	322,274,167.85
සංචිත	15		
ප්‍රාග්ධන සංචිත		**1,923,741.00**	1,923,741.00
ප්‍රතිඇගයුම්කරණ සංචිත		**766,658,227.32**	766,658,227.32
රන් තොග ප්‍රති ඇගයුම්කරණ සංචිතය		**13,558,612.40**	9,216,733.38
විදේශ විනිමය ගැලපුම් සංචිත		**19,523.00**	19,523.00
රඳවාගත් ඉපැයුම්		**497,712,121.83**	513,246,950.24
		1,279,872,225.55	1,291,065,174.94
		1,609,943,954.93	1,618,339,342.79
වගකීම්			
ජංගම නොවන වගකීම්			
ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම	16	**8,474,657.32**	14,926,610.82
බැංකු ණය - මහජන බැංකුව		**20,333,333.73**	24,000,000.36
විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්	17	**33,286,336.14**	34,547,501.14
		62,094,327.19	73,474,112.32
ජංගම වගකීම්			
වෙළඳ ණයකරුවෝ		**77,872,027.87**	53,633,163.42
වෙළඳ ණයගැතියන් වෙතින් ලද අතිරේක මුදල්		**494,867.31**	441,109.54
උපචිත වියදම්	18	**35,908,373.20**	23,819,449.91
සෙසු ජංගම වගකීම්	19	**14,192,406.54**	11,918,684.80
බදුකරණය සඳහා ප්‍රතිපාදනය	20	**7,364,917.38**	9,323,500.38
ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල		**15,000,000.00**	15,000,000.00
බැංකු ණය - මහජන බැංකුව		**3,999,999.96**	3,999,999.96
විලම්බිත ආදායම - අමුද්‍රව්‍ය		**44,645,717.10**	-
		199,478,309.36	118,135,908.01
සමස්ත අරමුදල් හා වගකීම්		**1,871,516,591.48**	1,809,949,363.12

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම දරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අත්සන් කළේ: 14193 නිරණ අංකයට අනුව 2022/04/28 දින ගිණුම් අනුමත කරන ලදී.

සභාපති	කළමනාකාර අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	සාමාන්‍යාධිකාරී	සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

දිනය .....

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

2021 දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වසර සඳහා

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන	**2021**	2020
		රු. ශත.	රු. ශත.
අලෙවිය	**23**	**800,223,255.84**	676,304,359.11
අඩු කළා: අලෙවි පිරිවැය	**24**	**593,821,274.03**	471,829,805.62
දළ ලාභය / (අලාභය)		**206,401,981.81**	204,474,553.49
සෙසු ආදායම් / (වියදම්)	**25**	**13,214,906.34**	8,689,122.16
		219,616,888.15	213,163,675.65
අඩුකළා: පරිපාලන හා ආයතනික වියදම්	**26**	**152,912,173.92**	135,101,872.18
අලෙවි හා බෙදාහැරීම් වියදම්	**27**	**83,628,233.97**	80,337,263.92
		236,540,407.89	215,439,136.10
මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය		**(16,923,519.74)**	(2,275,460.45)
ශුද්ධ මූල්‍ය ආදායම / (වියදම)	**28**	**2,423,183.51**	11,739,030.70
බදුකරණයට පෙර ශුද්ධ අතිරික්තය		**(14,500,336.23)**	9,463,570.25
අඩුකළා: ආදායම් බදු වියදම්	**29**	-	3,359,179.42
බදුකරණයෙන් පසු ශුද්ධ අතිරික්තය		**(14,500,336.23)**	6,104,390.83
අඩුකළා: සැලකුණු ලාභාංශ බදු		-	-
		(14,500,336.23)	6,104,390.83
සෙසු විස්තීර්ණ ආදායම			
වත්කම් ප්‍රති ඇගයුම්කරණ ලාභ / (අලාභ)		-	-
වසර සඳහා වන සමස්ත සෙසු විස්තීර්ණ ආදායම		-	-
වසර සඳහා වන සමස්ත විස්තීර්ණ ආදායම		**(14,500,336.23)**	6,104,390.83

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනිවාර්ය කොටසක් වෙයි.

වරහන් තුළ දී ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

2021 දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වසර සඳහා

නිෂ්පාදන පිරිවැය ප්‍රකාශනය

	සටහන	**2021**	2020
අමුද්‍රව්‍ය පරිභෝජනය		**රු. ශත.**	**රු. ශත.**
ආරම්භක තොගය		**70,360,761.00**	52,585,964.45
එකතු කළා:මිලදී ගැනීම්		**416,982,912.24**	255,816,105.25
		487,343,673.24	**308,402,069.70**
අඩු කළා: තොග හානි		**-**	-
		487,343,673.24	**308,402,069.70**
අඩු කළා: සංවෘත තොගය		**133,273,636.49**	70,360,761.00
අමුද්‍රව්‍ය පරිභෝජන පිරිවැය		**354,070,036.75**	**238,041,308.70**
ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජනය			
ආරම්භක තොගය		**21,824,951.00**	14,487,204.00
එකතු කළා: මිලදී ගැනීම්		**44,053,135.85**	45,365,988.33
		65,878,086.85	**59,853,192.33**
අඩු කළා: අවසන් තොගය		**16,364,357.22**	21,824,951.00
ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජන පිරිවැය		**49,513,729.63**	**38,028,241.33**
දැවිතෙල් පරිභෝජන පිරිවැය			
ආරම්භක තොගය		**607,200.00**	1,022,400.00
එකතු කළා: මිලදී ගැනීම්		**26,482,622.00**	19,936,212.00
		27,089,822.00	**20,958,612.00**
අඩු කළා: අවසන් තොගය		**1,059,750.00**	607,200.00
දැවිතෙල් පරිභෝජන පිරිවැය		**26,030,072.00**	**20,351,412.00**
සෘජු ශ්‍රම වියදම	**21**	**116,991,363.27**	97,446,171.69
ප්‍රාථමික පිරිවැය		**143,021,435.27**	**117,797,583.69**
කර්මාන්තශාලා පොදුකාර්ය පිරිවැය			
වක්‍ර වියදම්	**22**	**90,841,978.55**	77,443,371.10
එකතු කළා: ආරම්භක සම්පූර්ණ නොකළ එකතු කිරීම		**15,108,788.00**	11,832,178.00
අඩුකළා: හානි වූ නිම නොකළ කටයුතු අඩුකළා: අවසාන සම්පූර්ණ නොකළ		**21,926,628.00**	15,108,788.00
		84,024,138.55	**74,166,761.10**
වසරේ සමස්ත නිෂ්පාදන පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළට ඉදිරියට ගෙනයන ලදී		**630,629,340.20**	**468,033,894.82**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

2021 දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වසර සඳහා වූ

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

	2021	2020
	රු. ශත.	රු. ශත.
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
බදුකරණයට පෙර ශුද්ධ ලාභය	**(14,500,336.23)**	9,463,570.25
ගැලපීම්		
ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම්	(6,451,953.50)	4,695,953.63
ක්ෂය වීම්	54,438,222.14	52,052,441.11
ක්‍රමක්ෂය භාණ්ඩාගාර අරමුදල් (ක්ෂයවීම්)	(20,702,438.47)	(24,526,124.65)
සේවක ප්‍රතිලාභ ගැලපීම්	6,608,505.00	6,132,810.50
පෙර වසරේ ගැලපීම්	(1,034,492.18)	8,906,193.28
ක්‍රමක්ෂය - අනුරාධපුර ගොඩනැගිලි ගිවිසුම	497,321.24	497,321.23
	18,854,828.00	57,222,165.35
කාරක ප්‍රාග්ධනය වෙනස් කිරීමට පෙර ලාභය		
තොග වැඩිවීම/අඩුවීම	(99,793,182.05)	(27,188,804.23)
කාර්ය මණ්ඩල ණය වැඩිවීම/අඩුවීම	1,665,927.64	(2,096,136.36)
පෙර ගෙවීම් හා අත්තිකාරම් වැඩිවීම/අඩුවීම	(2,540,487.12)	(8,558,342.95)
විවිධ තැන්පතු වැඩිවීම/අඩුවීම	(354,000.00)	(396,000.00)
වෙළඳ ණයකරුවන් ආශ්‍රිත වැඩිවීම/අඩුවීම	4,299,974.02	89,074,592.46
වෙළඳ ණය හිමියන් සම්බන්ධ වැඩිවීම/අඩුවීම	24,238,864.45	5,220,849.25
වෙනත් ජංගම බැරකම් සම්බන්ධ වැඩිවීම/අඩුවීම	2,273,721.74	1,409,415.38
උපචිත වැය වැඩිවීම/අඩුවීම	12,088,923.29	2,268,384.98
ප්‍රති ඇගයුම්කරණ වැඩිවීම/අඩුවීම		-
වෙළඳ ණය හිමියන් වෙනින් ලත් අතිරේක මුදල් වැඩිවීම/අඩුවීම	4,765.00	(4,765.00)
වෙළඳ ණයකරුවන් වෙනින් ලත් අතිරේක මුදල් වැඩිවීම/අඩුවීම	53,757.77	99,464.41
අමුද්‍රව්‍ය විලම්බිත ආදායම් වැඩිවීම/අඩුවීම	44,645,717.10	-
	5,438,809.84	117,050,823.29
අඩුකළා: ගෙවූ පාරිතෝෂික	(7,869,670.00)	(10,623,565.70)
ගෙවූ බදු මුදල්	(1,958,583.00)	(106,511.46)
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(4,389,443.16)**	106,320,746.13
අයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහයන්		
පුද්ගල ආරක්ෂක උපකරණ (PPE) අත්පත් කරගැනීම	(40,867,359.22)	(18,311,238.18)
සිදු කරමින් පවත්නා කටයුතුවලට අදාළ ආයෝජනය	1,808,795.35	-
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	(13,347,996.06)	(13,493,675.29)
ආන්තික ගිණුමේ ආයෝජනය	1,809,960.11	(1,446,003.89)
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(50,596,599.82)**	(33,250,917.36)
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
මහා භාණ්ඩාගාරයෙන් ලද මුදල්	23,500,000.00	5,000,000.00
පුදාන / (ආපසු ගෙවීම්) බැංකු ණය	(3,666,666.63)	(5,753,500.13)
මූල්‍ය කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**19,833,333.37**	(753,500.13)
මුදල් හා මුදල් සමාන දෑ සම්බන්ධ ශුද්ධ ඉහළ / පහළ යාම	**(35,152,709.61)**	72,316,328.64
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	136,911,170.18	64,594,841.54
වසර අවසන මුදල් හා මුදල් සමාන දෑ	**101,758,460.57**	136,911,170.18

	2021	2020
	රු. ශත.	රු. ශත.
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.අ. 97100-182315453	12,170,097.37	38,749,766.37
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.අ. 97100-272315453	16,304,545.89	23,979,132.31
ලංකා බැංකුව - ආයතනික ශාඛාව - ගි.අ.00001209	59,991,168.62	65,333,027.89
ඉතුරුම් ගිණුම	6,291,745.46	4,210,243.32
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.අ. 97200-432315453	6,800,903.23	4,639,000.29
ලංකා බැංකුව - ආයතනික ශාඛාව - ගි.අ.87653784	200,000.00	-
	101,758,460.57	136,911,170.18

සම කොටස් **විචලන ප්‍රකාශනය**

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රාජ්‍ය භාණ්ඩාගාරය	ලෝ.සෞ.සං.	අමාත්‍යාංශ හා රජයේ ආයතන	ප්‍රාග්ධන සංචිත	ප්‍රති-ඇගයුම්කරණ සංචිත	රන් තොග ප්‍රති-ඇගයුම්කරණ සංචිතය	විදේශ මුදල් වර්ධන සංචිතය	රඳවාගත් ඉපැයීම්	එකතුව
	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
2019.01.01. දිනට ශේෂය	**5,000,000.00**	**317,518,552.85**	**3,994,341.00**	**761,274.00**	**1,923,741.00**	**766,658,227.32**	**9,216,733.38**	**19,523.00**	**513,246,950.24**	**1,618,339,342.79**
පෙර වසරේ ගැලපීම	-	-	-	-	-	-	-	-	(2,206,086.63)	**(2,206,086.63)**
වසර තුළ ගැලපීම්										
වසර සඳහා ලද මුදල්	-	23,500,000.00	-	-	-	-	-	-	-	**23,500,000.00**
භාණ්ඩාගාර අරමුදල් ක්‍රමක්ෂය	-	(20,702,438.47)	-	-	-	-	-	-	-	**(20,702,438.47)**
රන් තොග ප්‍රති-ඇගයුම්කරණ ප්‍රමාණය	-	-	-	-	-	-	4,341,879.02	-	-	**4,341,879.02**
වසර සඳහා වන සමස්ත විස්තීර්ණ ආදායම	-	-	-	-	-	-	-	-	(14,500,336.23)	**(14,500,336.23)**
ලිපිද්‍රව්‍ය පරිභෝජනය **(26.1)**	-	-	-	-	-	-	-	-	1,171,594.45	**1,171,594.45**
2021.12.31 දිනට ශේෂය	**5,000,000.00**	**320,316,114.38**	**3,994,341.00**	**761,274.00**	**1,923,741.00**	**766,658,227.32**	**13,558,612.40**	**19,523.00**	**497,712,121.83**	**1,609,943,954.93**

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.
වරහන් තුළ දී ඇති සංඛ්‍යා තුළින් අඩු කිරීම් දක්වයි.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් - 2021

1. **සාමාන්‍ය තොරතුරු**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1969 මැයි මස 11 දිනැති අංක 14853/1 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් 1969 වසරේ දී සංස්ථාපනය කරන ලදී. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම යන ස්ථානයේ පිහිටා ඇත.

ප්‍රධාන කටයුතු හා මෙහෙයුම් ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන කටයුතු වනුයේ ආයුර්වේද බෙහෙත් හා ඔසු නිෂ්පාදනය කොට ඒවා රජයේ රෝහල්, ආයුර්වේද වෛද්‍යවරුන් හා පුද්ගලික අංශය වෙත අලෙවි කිරීමයි.

2021 දෙසැම්බර් මස 31වන දිනට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ මුළු කාර්ය මණ්ඩලය 356ක් විය (2020-326).

2. සැකසුම් පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සම කොටස් විචලන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ද සමඟින් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ("මූල්‍ය ප්‍රකාශන") යන අන්තර්ගතයන්ගෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL) විසින් පනවන ලද නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS / LKAS) හා ශ්‍රී ලංකා රජය විසින් සකස් කරන ලද මුදල් රෙගුලාසි ප්‍රකාර සකස් කොට ඇත.

2022 අප්‍රේල් මස 28 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය පවරන ලදී. (අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංකය 14193).

2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකසා ඇත.

මූල්‍ය ප්‍රකාශනයන් තුළ උද්ධමනීය සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදුකර නොමැත.

2.3 මූල්‍ය බැඳීම් සපුරාලන ආයතනයක් ලෙස

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව නුදුරු අනාගතය තුළ මූල්‍ය බැඳීම් සපුරාලන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීම විෂයයෙහි දක්වන සමත්කම පිළිබඳ තක්සේරුවක් සිදුකර ඇති අතර, ඔවුන් විසින් සංස්ථාවේ කටයුතු ඇවර කිරීමක් හෝ නවතාලීමක් සිදු කළ යුතු බවට පුරෝකථනය කරනු නොලබයි.

2.4 සන්සන්දනාත්මක තොරතුරු

වඩාත් හොඳින් ඉදිරිපත් කරනු පිණිස හා පවත්නා වර්ෂය සමඟින් සන්සන්දනය කිරීමට හැකිවනු පිණිස පසුගිය වසරයන්හි මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය අදාළ තැන්හි සංශෝධනය කර ඇත.

2.5 ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදා ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාවෙහි යෙදවීමට හා වාර්තාගත වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ප්‍රමාණයට බලපාන්නාවූ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන සිදු කිරීම විය යුතු වේ.

විනිශ්චයන් හා ඇස්තමේන්තු පවත්නා තත්ත්වයන් යටතේ සාධාරණ බවට විශ්වාස කරන්නාවූ අපේක්ෂාවන්ද ඇතුළත් ඓතිහාසික අත්දැකීම්, ප්‍රවණතාවයන් හා සෙසු සාධකයන් මත පදනම් වේ. ඒ අනුව, සැබෑ ප්‍රතිඵල මෙම විනිශ්චයන්ගෙන් හා ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිවේ.

ඇස්තමේන්තුවල හා එයට පදනම්ගත උපකල්පනයන්ගේ වලංගුතාවය තහවුරු කරනු වස් ඒවා මූල්‍ය බැඳීම් සපුරාලීමේ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සමාලෝචනය කෙරෙන හා බලපෑමට ලක්වන යම් මතු සමයන් තුළද ගිණුම්කරණ ඇස්තමේන්තුවලට අදාළ ප්‍රතිශෝධනයන් හඳුනාගනු ලබයි. මූල්‍ය ප්‍රකාශනයන් තුළ හඳුනාගෙන ඇති සංඛ්‍යාවනට වැඩියෙන්ම බලපෑමක් ඇති කරන්නාවූ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීම සම්බන්ධ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් තුළ ඇතුළත් කර ඇත:

2.6 විදේශ මුදල් ගනුදෙනු

(අ) කාර්ය හා ඉදිරිපත් කිරීමේ මුදල්

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශනයන් තුළ ඇතුළත් කර ඇති අයිතමයන් එම ආයතනය ක්‍රියාත්මකවන මූලික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය (කාර්ය මුදල්) යොදාගනිමින් මිනුම්ගත කෙරේ. මූල්‍ය ප්‍රකාශන සංස්ථාවේ කාර්ය හා ඉදිරිපත් කිරීමේ මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලින් (ශ්‍රී ලං.රු.) ඉදිරිපත් කෙරේ.

(ආ) ගනුදෙනු හා ශේෂ

ගනුදෙනු සිදුවන දිනයන්හි පවත්නා විනිමය අනුපාතයන් භාවිතයෙන් විදේශ විනිමය ගනුදෙනු කාර්ය මුදල් බවට පරිවර්තනය කෙරේ.

03. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදාගනු ලබන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. අන් අයුරකින් ප්‍රකාශ කොට ඇත්තේ නම් විනා මෙම ප්‍රතිපත්ති ස්ථීර ලෙස ඉදිරිපත් කරන ලද සියලු වර්ෂයනට යොදාගනු ලැබ ඇත.

3.1 වත්කම් හා ඒවා ඇගයීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම වත්කම් සේ වර්ගීකරණය කොට ඇති වත්කම් මුදල්, බැංකු ශේෂ සංස්ථාවේ සාමාන්‍ය කටයුතු චක්‍රය තුළ හෝ වාර්තාකරණ කාලයේ සිට එක් වසරක් ඇතුළත හෝ යන දෙකෙන් කවර හෝ කලින් එළැඹෙන දිනයෙහි මුදල් බවට උපලබ්ධිගත කෙරෙනු ඇතැයි අපේක්ෂිත වත්කම් වේ. ජංගම වත්කම් හැර අන් වත්කම් වනුයේ වාර්තා කිරීමේ දිනයේ සිට එක් වසරකට වැඩි කාලයක් තුළ රඳවා තබාගැනීමට සංස්ථාව විසින් අපේක්ෂා කරන්නාවූ වත්කම් වේ.

3.1.1 දේපළ, පිරියත හා උපකරණ

3.1.1.1 හඳුනා ගැනීම හා මිනුම්ගත කිරීම

දේපළ, පිරියත හා උපකරණ තුළට ඇතුළත්වන අයිතමයක පිරිවැය එය මිලදීගත් මිල හා වත්කම එහි අපේක්ෂිත පරිහරණය සඳහා අවශ්‍ය කාර්ය මට්ටමට ගෙන එනු පිණිස සෘජුවම යෙදෙන පිරිවැයක්වේ නම් එයද වේ.

ස්වයං-ඉදිකිරීම්ගත වත්කම් පිරිවැය තුළට ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය හා වත්කම එහි අපේක්ෂිත පරිහරණය වෙනුවෙන් කාර්යගත මට්ටමට ගෙන එනු පිණිස සෘජුවම දැරීමට සිදුවන වෙනයම් පිරිවැයක්වේ නම් එයද ඇතුළත් වේ. මේ තුළට අයිතම කැබලිවලට ගලවා ඉවත් කොට ඒවා පිහිටි ස්ථානය නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැයද සුදුසුකම් ලත් වත්කම් මත වූ ණයට ගත් පිරිවැයද අයත් වේ.

යම් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක කොටසක් තුළ විවිධ වූ ප්‍රයෝජනවත් ජීව කාලයන් පවත්නා විටදී, ඒවා දේපළ, පිරියත හා උපකරණවලට අදාළ වෙන් වෙන් වූ අයිතම (ප්‍රධාන සංඝටක) වශයෙන් ගිණුම්ගත කරනු ලැබේ.

දේපළ පිරියත හා උපකරණයන්හි පවත්නා වටිනාකම් පියවාගත නොහැකි බව සිදුවීම් හෝ වෙනස්වන තත්ත්වයන් තුළ පෙනී යන විටදී ඒවාට හානි සිදුවී ඇත්තේ දැයි සමාලෝචනය කරනු ලැබේ. වත්කමක පවත්නා වටිනාකම ඇස්තමේන්තුගත පියවාගත හැකි වටිනාකමට වඩා ඉහළ අගයක් ගන්නේ නම්, එහි පවත්නා වටිනාකම වහා එහි පියවාගත හැකි වටිනාකමට ලේඛනගත කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් අපහරණයේදී සිදුවන ලාභය හා අලාභය අපහරණයෙන් ලද මුදල හා දේපළ, පිරියත හා උපකරණයේ අන්තර්ගත වටිනාකම අතර වෙනස ලෙස නිර්ණය කෙරෙන අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ සෙසු ආදායම් යටතේ හඳුනා ගැනේ.

3.1.1.2 පසු පිරිවැය

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක කොටසක් මාරු කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලායන අතර එහි පිරිවැය විශ්වසනීය ලෙස මිනුම් ගත කළ හැක්කේය යන කරුණ බොහෝ කොටම විය හැක්කක් නම්, එම අයිතමයේ අන්තර්ගත වටිනාකම තුළ හඳුනාගැනේ.
දේපළ, පිරියත හා උපකරණයන් සේවාකරණයේ එදිනෙදා පිරිවැය ලාභ හෝ අලාභ සිදුවන විටදී හඳුනා ගැනේ.

3.1.1.3 නිල පිළිගැනීම අවලංගු කිරීම

යම් දේපළ, පිරියත හා උපකරණයක් අපහරණයේදී හෝ එය පරිහරණය තුළින් හෝ අපහරණය තුළින් මතු ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකෙරෙන විටදී එහි අන්තර්ගත වටිනාකමට අදාළ නිල පිළිගැනීම අවලංගු කරනු ලැබේ. නිල පිළිගැනීම අවලංගු කිරීමෙන් ඇතිවන ලාභ හෝ අලාභ ලාභාලාභයන්හි සෙසු ආදායම් තුළ හඳුනාගනු ලබයි.

3.1.1.4 අනුරාධපුර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ පිරිවැය

අනුරාධපුර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ පිරිවැය පස් වසර කාල පරිච්ඡේදය තුළ වියදමක් ලෙස හඳුනා ගැනේ. (වසර 5ක කාලය සඳහා දේපළ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත මාරුකර ඇත).

3.1.1.5 නරක් වූ හා අඩමාන ණය

නරක් වූ ණය

අදාළ මුදල පියවාගත නොහැකි බවට ස්ථීර වූ පසු නරක්වූ ණය ලාභාලාභ ගිණුමේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

අඩමාන ණය

අයකර ගැනීමට ඉතිරිව ඇති ණය ප්‍රතිශතයට අනුව අඩමාන ණය ලාභාලාභ ගිණුමේ වියදමක් ලෙස හඳුනා ගැනේ. සමස්ත ණයකරුවන් අතරින් 25%ක් අඩමාන ණයකරුවන් ලෙස හඳුනා ගැනේ.

3.1.1.6 ණය ගැනීමේ පිරිවැය

අපේක්ෂිත පරිහරණය හෝ අලෙවිය සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාල පරිච්ඡේදයක් ගතවන්නාවූ, සුදුසුකම් ලත් වත්කමක් අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයට සෘජුවම සම්බන්ධවන ණය ගැනීමේ පිරිවැය වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනගත කෙරේ. ප්‍රග්ධනගතකරණයට සුදුසුකම් ලබන ණය ගැනීමේ පිරිවැය ප්‍රමාණයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 - ණය ගැනීමේ පිරිවැය ප්‍රකාර නිර්ණය කෙරේ. ප්‍රාග්ධනගත නොකෙරෙන ණය ගැනීමේ පිරිවැය ඒවා සිදුවූ කාල පරිච්ඡේදය තුළ සිදුකරන ලද වියදම් සේ හඳුනාගනු ලබන අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළට අය කිරීම් ලෙස ඇතුළත් කෙරේ.

3.1.1.7 ක්ෂය වීම්

ක්ෂය වීම යන්න යම් වත්කමක පිරිවැය හෝ එම පිරිවැය වෙනුවෙන් ආදේශනය කෙරෙන වෙනත් මුදලකින් එහි අවශේෂ වටිනාකම අඩු කිරීමෙන් ලැබෙන ක්ෂය කළ හැකි මුදල මත ගණනය කෙරේ. ලාභ අලාභ තුළ ක්ෂය වීම යන්න යම් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක එක් එක් කොටසේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත සරල රේඛීය පදනමකින් හඳුනාගනු ලබන අතර, එසේ කරනුයේ මෙමගින් එම වත්කම තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කෙරෙනු ඇතැයි අපේක්ෂිත රටාව ඉතාමත් ආසන්නයෙන් නිරූපණය වන බැවිනි.

සංස්ථාව විසින් කල්බදු කාල පරිච්ඡේදය අවසානය වනවිට එහි හිමිකාරිත්වය ලබාගනු ඇතැයි යන සාධාරණ විශ්වාසයක් පවත්නේ නම් විනා කල්බදුගත වත්කම් කල්බදු කාල පරිච්ඡේදයේ හා එහි ප්‍රයෝජනවත් ආයු කාලයේ වඩාත් කෙටි කාලයට අනුව ක්ෂය කෙරේ. ඉඩම් ක්ෂය කරනු නොලැබේ. මෙම සංස්ථාවට අදාළ කල්බදු ගත වත්කම් නොමැත.

වර්තමාන හා සන්සන්දනාත්මක කාල පරිච්ඡේදයන් සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයන් හා ක්ෂයවීම් අනුපාතයන් පහත පරිදි වේ:

වත්කම් කාණ්ඩය	**ප්‍රයෝජනවත් ආයු කාලය (වර්ෂ)**	**ක්ෂයවීම් අනුපාතය (%)**
ගොඩනැගිලි	වසර 20	5%
යන්ත්‍ර	වසර 06.66	15%
ජල සම්පාදන උපකරණ	වසර 06.66	15%
රසායනාගාර උපකරණ	වසර 06.66	15%
කාර්යාල උපකරණ	වසර 10	10%
මෝටර් වාහන	වසර 05	20%
මෙවලම් හා උපකරණ	වසර 03	33.33%

වත්කමක් ක්ෂයවීම එය පරිහරණය සඳහා පවත්නා කාලය තුළ ආරම්භවන අතර, වත්කම ක්ෂයවීම අවසන් වනුයේ එය විකිණීම සඳහා තැබෙන බවට වර්ගීකරණය කෙරෙන දිනය හෝ එම වත්කමෙහි නිල පිළිගැනීම අවලංගු කෙරෙන දිනය යන දෙකෙන් කලින් එළැඹෙන දිනයේදීය.

ක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාලයන් හා අවශේෂ වටිනාකම් එක් එක් මූල්‍ය වර්ෂාවසානයේදී සමාලෝචනය කෙරෙන අතර සුදුසු නම් ගලපනු ලබයි.

3.1.1.8 සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන්

වසර තුළ සිදු කෙරුණු හා වාර්තාකරණ දිනය වනවිට සම්පූර්ණ නොවූ ප්‍රාග්ධන වියදම් සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන් ලෙස පෙන්වනු ලබන අතර, වසර තුළ අවසන් කරනු ලැබ පරිහරණය සඳහා තබා ඇති ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණ වෙත මාරු කර ඇත.

3.1.1.9 මූල්‍ය අවදානම් කළමනාකරණය

ණය අවදානම

ණය අවදානම යනු ගනුදෙනුකරුවෙකු හෝ යම් මූල්‍ය ලේඛනයක හරස් පාර්ශ්වකරුවෙකු සිය කොන්ත්‍රාත්මය වගකීම් සපුරාලීමට අපොහොසත් වන්නේ නම් සංස්ථාවට සිදුවන මූල්‍ය අලාභය වන අතර සංස්ථාවට ගනුදෙනුකරුවන් හා ආශ්‍රිත පාර්ශ්වකරුවන් වෙතින් ලැබිය යුතුව පවත්නා දෙයින් මූලික වශයෙන් ඉස්මතු වේ.

වෙළඳ හා සෙසු ලැබිය යුතු දේ හා ආයෝජන සම්බන්ධයෙන් සිදුවූ ඇස්තමේන්තුගත අලාභයන් නියෝජනය කරන හානි සඳහා සංස්ථාව විසින් දීමනාවක් පනවනු ලබයි.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලබා දෙමින් පියවනු ලබන සිය මූල්‍යමය වගකීම් හා සම්බන්ධ බැඳීම් සපුරාලීමේ දුෂ්කරතාවයන් පවත්නා විටදී එසේ සංස්ථාව විසින් මුහුණ දෙනු ලබන දුෂ්කරතාවයන් වේ. ද්‍රවශීලතාවය කළමනාකරණය කරගැනීමෙහි ලා සංස්ථාවේ ප්‍රවේශය වනුයේ සංස්ථාව වෙත පිළිගත නොහැකි අලාභයන් සිදුකරගැනීමකින් හෝ එහි කීර්ති නාමයට හානි සිදුකර ගැනීමකින්ද තොරව සාමාන්‍ය හා පීඩනකාරී තත්ත්වයන් යටතේ සපුරාලීමට ඇති වගකීම් සපුරාලීමට තරම් ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් නිරන්තරයෙන්, හැකිතාක් දුරට, පවත්වාගෙන යන බවට වගබලා ගැනීමයි.

3.1.1.10 භාණ්ඩ තොග

භාණ්ඩ තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මිනුම්ගත කරනු ලැබේ. සමාගම විසින් ශුද්ධ උපලබ්ධිගත අගය උපයෝගයෙන් තොග තක්සේරු නොකරන ලදී. මක්නිසාද, සමාගම විසින් වසර තුළ වෙළඳපල වටිනාකමට අඩු වටිනාකමකට නිෂ්පාදන අලෙවි නොකරන ලද බැවිනි. භාණ්ඩ තොග පිරිවැය තුළට තොග අත්පත් කරගැනීමේදී දරන්නට සිදුවූ වියදම්, ඒවා දැනට පවත්නා ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමේදී දරන්නට සිදුවූ සෙසු වියදම් හා නිෂ්පාදන හෝ මාරු කිරීමේ පිරිවැයද ඇතුළත් වේ. සමාගම විසින් ප්‍රධාන කාර්යාලයේ අමුද්‍රව්‍ය හා නිමා භාණ්ඩ සම්බන්ධයෙන් පැමිණි අනුපිළිවෙලගත (FIFO) සූත්‍රය යොදාගන්නා ලදී. අලෙවි මධ්‍යස්ථානයන්හි තොග සඳහා පැමිණි අනුපිළිවෙලගත වටිනාකම ලබාගැනීම දුෂ්කර වන බැවින් අලෙවි මධ්‍යස්ථාන සඳහා පහත පරිදි බරතැබූ සාමාන්‍ය පිරිවැය (WAC) සූත්‍රය යොදාගන්නා ලදී.

ආරම්භක වටිනාකම (අමුද්‍රව්‍ය තොගය) + අවසන් වටිනාකම (අමුද්‍රව්‍ය තොගය)/2. }

3.1.1.10.1 නොමිලේ ලද තොග තක්සේරුව

කළමනාකාරිත්වයේ තීරණයකට අනුව උක්ත තොගය මෙම වසර තුළ තක්සේරු කර ඇත. ගිණුම්කරණ පිවිසුම් සටහන් පහත පරිදි යොමු කරවන ලදී

තොග	හර (DR)
අමුද්‍රව්‍යවලින් විලම්බිත ආදායම	බැර (CR)

නිෂ්පාදනය සඳහා යොදාගන්නා ලද නොමිලයේ ලද අමුද්‍රව්‍ය හා එම නිෂ්පාදනය දක්වා හඳුනාගන්නා ලද අමුද්‍රව්‍යවලින් විලම්බිත ආදායම ලාභාලාභ ගිණුමේ සෙසු ආදායම් තුළට මාරු කෙරෙනු ඇත.

3.1.1.11 වෙළඳ අංශයෙන් ලැබිය යුතු දේ

සංස්ථාවට මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලබාගැනීමේ කොන්ත්‍රාත්මය හිමිකමක් පවත්නා විටදී පමණක් සංස්ථාව විසින් සිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මූල්‍ය වත්කම් ලෙස වෙළඳ අංශයෙන් ලැබිය යුතු දේ හඳුනාගනු ලබයි.

වෙළඳ අංශයෙන් ලැබිය යුතු දේ යනු සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ අලෙවි කරන ලද ද්‍රව්‍ය හෝ ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් ගනුදෙනුකරුවන් වෙතින් ලැබිය යුතුවන මුදල් ප්‍රමාණයන් වේ. ඒවා එක්රැස් කර ගැනීම වසරක් හෝ එයට අඩු කාලයක් තුළ සිදු කිරීමට අපේක්ෂා කරන්නේ නම්, (හෝ සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් චක්‍රය තුළ සිදු කරන්නට අපේක්ෂා කරන්නේ නම්) ඒවා ජංගම වත්කම් සේ වර්ගීකරණය කරනු ලැබේ. නොඑසේ නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

වෙළඳ අංශයෙන් ලැබිය යුතු දේ අපේක්ෂිත උපලබ්ධි කළ හැකි අගයට ගණනය කෙරෙන අතර වසරකට වැඩි ලෙස ඉකිරිව පවත්නා කාල පරිච්ඡේදය සැලකිල්ලට ගැනීමෙන් පසුව වසර අවසානයේදී ඉකිරිව පවත්නා සියලු මුදල් ප්‍රමාණයන් පිළිබඳ සිදුකරන සමාලෝචනයක් මත පදනම්ව අඩමාන ලෙස ලැබිය හැකි දේ සම්බන්ධ ඇස්තමේන්තු සකස් කරනු ලැබේ.

කොන්ත්‍රාත්මය හිමිකමේ මුල් නියමයන් ප්‍රකාර ලැබිය යුතුව පවත්නා සියලු මුදල් ප්‍රමාණයන් සංස්ථාවට රැස්කර ගැනීමට හැකි නොවනු ඇති බවට වූ විෂය මූලික සාක්ෂි පවත්නා විටදී වෙළඳමය වශයෙන් ලැබිය යුතු දේට අදාළ අලාභ හානි පිළිබඳ ප්‍රතිපාදනයක් පනවනු ලැබේ.

3.1.1.12මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ අත ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු හා කෙටි කාලීන අධි ද්‍රවශීලී ආයෝජන ලෙස අර්ථ නිරූපණය කරනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවශ්‍යතාවය සඳහා, මුදල් හා මුදල් සමාන දේ අත ඇති මුදල්, බැංකුවන ඇති තැන්පතු හා ගෙවිය යුතුව පවත්නා බැංකු අයිරාවන්හි ශුද්ධ අගයද යන අගයන්ගෙන් සමන්විත වේ.

3.2 වගකීම් හා ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරෙන වගකීම් යනු ඉල්ලුමට අනුව ගෙවිය යුතුවන හෝ වාර්තා කරන දිනයේ සිට වසරක් ඇතුළත ගෙවිය යුතුව පවත්නා ඒවා වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කිරීමේ දිනයේ සිට වසරක් ගතවූ පසු ගෙවීමට නියම වන ඒවා වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් සකස් කිරීමේදී සියලු දැනුවත් වගකීම් ගණනය කරන ලදී.

පසුගිය සිදුවීමක් හේතුකොටගෙන සංස්ථාවට විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ ධනාත්මක බැඳීමක් පවත්නා අතර එම බැඳීම පියවනු පිණිස ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි නම් ප්‍රතිපාදනයක් හඳුනාගනු ලබයි.

3.2.1 මහා භාණ්ඩාගාරයෙන් ලද දායකත්වයන්

සමුච්චිත අරමුදල ස්ථාවර වත්කම් තුළට මූල්‍යකරණය හා සම්බන්ධව රජයෙන් ලද සියලු මුදල්වල එකතුවෙන් සමන්විත වේ.

3.2.2 ණය ගැනීම්

ණය ගැනීම්, සිදුවූ ගනුදෙනු පිරිවැයෙන් ශුද්ධ වූ සාධාරණ වටිනාකම්වන් මූලික වශයෙන් හඳුනාගනු ලැබේ. ණය ගැනීම් ඉනික්බිති ක්‍රමක්ෂය පිරිවැයට ගෙනයනු ලැබේ; උත්පාදිත මුදල් හා මුදලා ගැනීමේ වටිනාකම යන අගයන් දෙක අතර යම් වෙනසක් පවත්නේ නම් එය ඵලදායී පොළී ක්‍රමවේදය යොදාගනිමින් ණය ගැනීම් කාල පරිච්ඡේදය පුරා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, වාර්තාකරන දිනය වනවිට කිසිදු ණය ගැනීමක් නොමැත.

3.2.3 සේවක ප්‍රතිලාභ

(අ) අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලැස්ම

සාමාන්‍යයෙන් වයස, සේවා කාලය හා වන්දි මුදල වැනි සාධක එකක් හෝ ගණනාවක් හේතුකොට විශ්‍රාම ගැනීමේදී සේවකයෙකු වෙත ලැබෙන ප්‍රතිලාභයේ වටිනාකම අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලසුම් තුළ අර්ථ නිරූපණය කෙරේ.

සියලු සුදුසුකම් ලත් සේවකයන් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ අවශ්‍ය කෙරෙන පරිදි සංස්ථාව විසින් අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලැස්මක් පවත්වාගෙන යනු ලබයි.

අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හඳුනාගෙන ඇති වගකීම වනුයේ හඳුනා නොගත් පෙර සේවා පිරිවැය සඳහා වූ ගැලපීම්ද සහිතව වාර්තා කරන දිනයට අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීමේ පවත්නා වටිනාකමයි. අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ; සේවක ප්‍රතිලාභ තුළ නිර්දේශිත ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය යොදාගනිමින් සමාගම විසින් වාර්ෂිකව ගණනය කරනු ලබයි. අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන වටිනාකම ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් ඒකකය මගින් නිරූපණය කරන හා අදාළ විශ්‍රාම වගකීමේ නියමයනට සමාන කල් පිරීමේ නියමයන් පවත්නා, රජයේ බැඳුම්කරයන්හි පොළී අනුපාතය යොදාගනිමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම්ගත කිරීම මගින් නිර්ණය කරනු ලැබේ.

